## 4 ක්ලබ් හෙඩ්

(අ) සාමාන්‍ය හැඩය

ක්ලබ් හෙඩ් පොදුවේ හැඩයෙන් සමාන වේ. සියලුම කොටස් එකට බැඳී ක්‍රියාත්මක වීමට තිබිය යුතුය. මෙහි කොටස් පැහැදිලිව තිබිය යුතු අතර උල්ලංඝනය නොවන අයුරින් පැවතිය යුතුය. නමුත් ඉඩකඩ ලබා දීමක් නොවන්නේ ,

(1) හෙඩ් හරහා හිල් පැවතීම.

(11) විනිවිද පෙනෙන දේවල් එකතු කොට තිබීම .වෙනත් උවමනා වලට හැර

(111) හෙඩ් වල ප්‍රධාන කොටසට පහත සඳහන් දේවල් යොදා තිබීම. ( නොබ්ස් , ප්ලේට්ස් , රොඩ්ස් හෝ පින්ස් ) දිග ප්‍රමාණයන් වෙනුවෙන් වෙනත් උවමනා දෙයක් වෙනුවෙන් පටර්ස් වලට වෙනස්කම් කල හැකිය.

(ආ) මිනුම් ප්‍රමාණයන් (ඩයිමෙන්ෂන්ස් )

හිල්සිට ක්ලබ් හෙඩ් වල ටෝ දක්වා දුර ප්‍රමාණය , මුහුණත සිට පසුපසට ඇති දුර ප්‍රමාණයට වඩා වැඩිය. මෙම මිණුම් ප්‍රමාණයන් මනිනු ලබන්නේ ක්ලබ්හෙඩ් සාමාන්‍ය ස්ථානගතව තිබෙන විට , හරස් රේඛාවන් අතර සෘජුව ඉදිරියට නෙරා තිබෙන (1) හිල් සහ ටෝ (11) මුහුණත සහ පසුපස (රූපය v11 බලන්න. ) ( මිණුම 1) හිල් පිටත කොටස පැහැදිලිව නැතිනම් එය අඟල් 0.625ක් (15.88 මිලිමීටර් ) ක්ලබ් සාමාන්‍ය ස්ථානගතව තිබෙන විටදී හරස් කොටසට ඉහලිනි. (මිනුම් බී බලන්න)

(ඇ) ස්ට්‍රයිකින් මුහුණත.

ක්ලබ් හෙඩ් වලට තිබෙන්නේ එක ස්ට්‍රයිකින් මුහුණතකි. පටර් වලට විරුද්ධ දෙපසින් මෙවැනි මුහුණත් දෙකක් තිබෙන්නට පුළුවන.

## (5) ක්ලබ් මුහුණත.

(අ) පොදු

ද්‍රව්‍ය සහ නිශ්පාදනය හෝ ඕනෑම සැකැස්මක් මුහුණත හෝ ක්ලබ්හෙඩ් වලට බාධාවක් නොවේ. පන්දුවට වඩා දඟ කැවීමක් හෝ මාර්ගය වෙනස් වීමක් නොවන ලෙසට පැවතිය යුතුය. ක්ලබ් වල මුහුණත තද විධියට පවතින අතර පහත සඳහන් (මාකින්ස්) හැර කුහර වලින් තොරව සුමුදුව තිබිය යුතුය.

(ආ) තදබල ප්‍රදේශය සහ ද්‍රව්‍ය

පහත සඳහන් මාකින්ස් හැරුන විට , තදබල විධියට ගැටෙන ප්‍රදේශය නිසා මතු වන බලපෑම ගැන සඳහන් වේ. (රූපය v111) බලන්න.

මෙසේ තදබල ලෙස බලපෑමට ලක්වන කොටස එකම ද්‍රව්‍ය වලින් යුක්තය. ලී ක්ලබ්ස් වලට වෙනත් දේවල් යොදා ගැනීමට පුළුවන. බලපෑම සිදුවන්නේ පිටියේ රළු ප්‍රදේශයකදීය.

(ඇ) ඉම්පැක්ට් ඒරියා මාර්කින්ස් වල රළු කොටස් හෝ ඉහළට ගිය කොටස් ෆින්ගර් ටෙස්ට් මගින් තීන්දු කෙරේ. ඉම්පැක්ට් ඒරියා වලට යොදා ගන්නා ගෲව්ස් (නැම් කොටස්) සහ පන්ච් මාක්ස් (හිල් සළකුණු) පහත සඳහන් ආකාරයට විය යුතුය.

(1) ගෲව්ස් (නැම් කොටස්)

පැති සහ හරස් අතට සම ප්‍රමාණ ලෙස ගෲව්ස් යොදා ගත හැකිය. (රූපය 1ං බලන්න.) මෙහි පළල සහ හරස් කොටස ක්ලබ් වල මුහුණත හරහා ගෲව්ස් දිගට තිබිය යුතුය. ගෲව්ස් එජර්ස් වටය අර්ධ විශ්කම්භයක හැඩයට අඟල් 0.020 ක් (මිලි මීටර් 0.5807) ඉක්මවා නොයා යුතුය. ගෲව්ස් වල පළල අඟල් 0.035 ක් (මිලි මීටර් 0.9) ඉක්මවා නොයා යුතුය. මේ වෙනුවෙන් සාන්ත ඇන්ඩෲස් හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජය විසින් අනුමත කොට තිබෙන අංශක 30 ක්‍රමය මිනුම් වෙනුවෙන් යොදා ගත හැකිය. මෙම ගෲව්ස් අතර දුර ප්‍රමාණය ගෲව්ස් එකක පළල මෙන් තුන් ගුණයක් ඉක්මවා නොයා යුතු අතර අඟල් 0.075 ක් (මිලි මීටර් 1.905) ට අඩු නොවිය යුතුය. ගෲව් එකක ගැඹුර අඟල් 0.020 ක් (මිලි මීටර් 0.508) ඉක්මවා නොයා යුතුය.

(11) පන්ච් මාර්ක්ස්

පන්ච් මාර්ක්ස් යොදා ගත හැකිය. එවැනි මාර්ක් එකක ප්‍රදේශය හතරැස් අඟල් 0.0044ක් ( මිලිමීටර් හතරැස් 2.84) ඉක්මවා නොයා යුතුය. මෙවැනි මාර්ක් එකක් එජාසන්ට් මාර්ක් එකක් ලඟට අඟල් 0.168ක් ( මිලිමීටර් 4.27) වඩා කිට්ටු නොවිය යුතුය. මෙය මැද සිට මැණිය යුතුය. පන්ච් මාක් එකක ගැඹුර අඟල් 0.040 ක් (මිලි මීටර් 1.02) ඉක්මවා නොයා යුතුය. ගෲව්ස් සමග පන්ච් මාර්ක්ස් සම්බන්ධ කොට යොදා ගන්නවා නම් , පන්ච් මාක් එකක් ගෲව් එකකට වඩා අඟල් 0.168 ක් (මිලි මීටර් 4.27) ලගට නොතිබිය යුතු අතර මැදින් මැද සිට මැණිය යුතුය.

(ඈ) ඩෙකරේට්ව් මාකින්ස්

ඉම්පැක්ට් ඒරියා වල මැද කොටස කිසියම් සටහනක් මගින් සළකුණු කිරීම හතරැස් සීමාවක් ඇතුලත එහි පැති දිගින් අඟල් 0.375 ක් (මිලි මීටර් 9.53) වන පරිදිය. මෙවැනි සටහනක් මගින් පන්දුවේ ගමන් මාර්ගයට බාධාවක් නොවිය යුතුය. ඉම්පැක්ට් ඒරියා පිටතද ඩෙකරේට්ව් මාකින්ස් වලට අවසර ඇත.

(ඉ) මෙටලික් නොවන ක්ලබ් මුහුණත මාකින්ස්

ඉහත සඳහන් මිණුම් ක්ලබ් වල මුහුණත ඉම්පැක්ට් ඒරියා මෙටල් හෝ එවැනි තද ද්‍රව්‍යකින් සකස් කල ඒවාට බලපායි. මුහුණත වෙනත් ද්‍රව්‍ය වලින් සෑදූ එහි ලොෆ්ට් ඇන්ගල් අංශක 24 ක් හෝ ඊට අඩු ක්ලබ්ස් වෙනුවෙන් බල නොපවත්වන අතර නමුත් පන්දුවේ ගමන වෙනස් කරන මාකින්ස් යොදා ගැනීම තහනම්ය. මෙවැනි ක්ලබ්ස් වල මුහුණත සහ ලොෆ්ට් ඇන්ගල් අංශක 24 ක් ඉක්මවා යන විටදී ගෲව්ස් යොදා ගැනීම උපරිම පළල අඟල් 0.040 ක් (මිලි මීටර් 1.02) සහ ඉපරිම ගැඹුර ගෲව් වලින් පළල මෙන් 1 2/1 ප්‍රමාණයක් වන නමුත් එසේ නොවනවා නම් ඉහත සඳහන් මිණුම් වලට අදාල විය යුතුය.

(ඊ) පටර් මුහුණත

ඉහත සඳහන් මිණුම් ඉම්පැක්ට් ඒරියා වල තද ගතිය , ද්‍රව්‍ය සහ මාකින්ස් වලට බලපවත්වන නමුත් පටර්ස් වලට බල නොපවත්වයි.

## උප ග්‍රන්ථය 111
## පන්දුව ( ද බෝල් )

1. බර

පන්දුවක බර අවුන්ස 1.620 කට ( 45.93 ග්‍රෑම් ) වඩා නොවිය යුතුය.

2. **ප්‍රමාණය**

පන්දුවක විශ්කම්භය අඟල් 1.680 කට (මිලි මීටර් 42.67) වඩා අඩු නොවිය යුතුය. මිණුම සම්පූර්ණ වන්නේ නියම බර සහිතව පන්දුවක් අඟල් 1.680 ක විශ්කම්භය සහිත වලල්ලක් හරහා තෝරා ගත් ස්ථාන 100 කින් 25 වතාවකට වඩා අඩුවෙන් වැටුනොත් පමණි. මෙම පරීක්ෂණය 23 = 1Cජ යටතේ කල යුතුය.

3. **ගෝලාකාර සම ප්‍රමාණ**

ගෝලාකාර සම ප්‍රමාණ පන්දුවකට වඩා වෙනස් වන ආකාරයට නිර්මාණය කිරීම , නිෂ්පාදනය කිරීම හා හිතා මතා නවිකරණය කිරීම නොකල යුතුය.

4. **පළමු වේග ප්‍රමාණය**

පන්දුවක පළමු වේග ප්‍රමාණය සාන්ත ඇන්ඩෘස්හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජය විසින් අනුමත කරන ලද උපකරණ මගින් මනින විටදී නියමිත ප්‍රමාණ පරීක්ෂණය ඉක්මවා නොයා යුතුය.

5. සමස්ථ දුර තත්වය

පන්දුවක උයුලාගෙන යාම සහ කාර්යය , සාන්ත ඇන්ඩෲස්හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජය විසින් අනුමත කරන ලද උපකරණ මගින් මැන්න විටදී , සමස්ථ දුර තත්වය වෙනුවෙන් සාන්ත ඇන්ඩෲස්හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජය විසින් අනුමත කරන ලද තත්වයන් ඉක්මවා නොයා යුතුය.

හැන්ඩි කැප්ස්

හැන්ඩි කැප්ස්වල වෙනස්කම් සහ අනුමත කිරීම් වලට ගොල්ෆ් නීතිරීති බල පවත්වන්නේ නැත. මේ සම්බන්ධ ප්‍රශ්ණ ජාතික ගොල්ෆ් සංගමයේ අනුමැතිය යටතට පත්වන අතර ඒවාට විසඳුම් ලබා දීම ඔවුන්ට පැවරේ.

සාන්ත ඇන්ඩෲස්හි රාජකීය සහ

පැරණි ගොල්ෆ් සමාජය විසින් අනුමත කරන

ලද,

ආධුනික තත්වයට නීතිරීති

2000 ජනවාරි 1 වැනිදා සිට බල පවත්වයි.

මෙම නීතිරීති වෙනස් කිරීම සහ ආධුනික තත්වයට අදාල තත්වයන් වෙනස් කිරීමට අයිතිය සාන්ත ඇන්ඩෲස්හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජය සතු වේ.

## අර්ථයන්

මෙහි අර්ථයන් අකාරාදි පිළිවෙලට සකස් කොට තිබෙන අතර සමහර ඒවා අදාල නීතිය ආරම්භයේ සඳහන් කොට තිබේ. මෙම අර්ථ කොටස් සමහර ස්ථාන වල ඇල අකුරු සහිතව තිබේ.

### ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයා

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයා මුදල් උපයා ගැනීමේ පරමාර්ථය ඇතිව ක්‍රීඩා නොකරන අතර සහ ගොල්ෆ් ක්‍රීඩාව උගැන්වීම සඳහා මුදල් අය නොකෙරෙන හෝ වෙනත් කාර්යයන් වෙනුවෙන් මුදල් ලබා නොගන්නා කෙනෙකි. මෙය නීතිරීති වල සඳහන් පරිදිය.

### කමිටුව

ක්‍රීඩාව පාලනය කරනු ලබන සංගමයකට කමිටුව අයත් වේ.

### ගොල්ෆ් හැකියාව සහ පිළිගැනීම.

ප්‍රාන්ත හෝ ජාතික මට්ටමින් ක්‍රීඩා කොට ලබා ගන්නා ගෞරවය මගින් ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකුගේ හැකියාව පිළිගනු ලබයි. ගොල්ෆ් ක්‍රීඩාව තුල පිළිගැනීම ලැබෙන්නේ හැකියාව මත මිස ගොල්ෆ් ක්‍රීඩාව වෙනුවෙන් සේවය කල නිලධාරියෙකු ලෙස නොවේ. ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකු සතුව තිබෙන්නේ හැකියාව හෝ පිළිගැනීමට යන්න තීරණය කරනු ලබන්නේ අදාල සංගමය විසිනි.

### පාලන සංගමය

ඕනෑම රටක ආධුනික තත්වය වෙනුවෙන් නීතිරීති ගැන පාලන සංගමය එම රටේ ජාතික සංගමය වේ. සටහන : සාන්ත ඇන්ඩෲස්හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජය මහා බ්‍රිතාන්‍ය සහ අයර්ලන්තයේ පාලන සංගමය වේ.

### උපදෙස්

ගොල්ෆ් ක්‍රීඩා කරන ශාරීරික තත්වයන් ,උපදෙස් , වලට ඇතුලත්ය. උදාහරණ : ක්‍රීඩා පිති පුහුණු පහර කිරීම සහ ගොල්ෆ් පන්දුවට පහර දීමේ සැබෑ ක්‍රමයන්

### කනිෂ්ඨ ගොල්ෆ් ක්‍රීඩකයා

කනිෂ්ඨ ගොල්ෆ් ක්‍රීඩකයා යනු තරඟාවලියකට පෙර තමාගේ 18 වැනි උපන් දිනය සම්පූර්ණ නොකල කෙනෙකි. මේ සඳහා පාලන සංගමය යොදා ගන්නා වයස ඇතුලත්ය.

### තෑගි වවුචරය

තෑගි වවුචරය යනු තරඟාවලියක් බාරව සිටින කමිටුවක් විසින් වෘත්තීය සාප්පුවකින් හෝ වෙනත් මිලදී ගැනීමේ ස්ථානයකින් බඩු මිලදී ගැනීමට නිකුත් කරනු ලබන්නකි.

### සිල්ලර අගය

ත්‍යාගයක සිල්ලර අගය යනු සාමාන්‍ය අලෙවි මිල වේ. මෙය අනුමත කොට තිබෙන මිලදී ගැනීමට හැකි දෙයකි.

### නීතිය හෝ නීතිරීති

නීතිය හෝ නීතිරීති යන්න ආධුනික තත්වය වෙනුවෙන් පාලන සංගමය වෙනුවෙන් විසින් අනුමත කොට ඇත.

### සංකේත ත්‍යාගය

, සංකේත ත්‍යාගය යනු රන් , රිදී , පිඟන් , විදුරු හෝ එවැනි සමාන දෙයකින් ස්ථිරව හා කාවද්දා තිබෙන ශුරතාවයකි.

### විශේෂ සම්මානය

තරඟාවලියක ත්‍යාග වලට වඩා උසස් විශේෂ දස්කම් හෝ ක්‍රීඩාවට කල දායකත්වය වෙනුවෙන් මෙම විශේෂ සම්මානය පිරි නැමෙයි. මෙය මුදල් සම්බන්ධ ත්‍යාගයක් නොවේ.

## නීතිය 1- ආධුනිකත්වය

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයා මුදල් අය නොකරන සහ මුදල් උපයා ගැනීමේ පරමාර්ථය ඇතිව ක්‍රීඩා නොකරන අතර ගොල්ෆ් ක්‍රීඩාව ඉගැන්වීම සඳහා මුදල් අය නොකරන හෝ වෙනත් කාර්යයන් වෙනුවෙන් මුදල් ලබා නොගන්නා කෙනෙකි. මෙය නීතිරීති වල සඳහන් පරිදිය.

මෙහි නීතිය හෝ නීතිරීති වෙනුවෙන් පාලන සංගමය විසින් අනුමත කොට තිබෙන ආධුනික තත්වයට අදාල නීතිරීති බලපවත්වයි.

### * 1 - 1 පොදු

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකු නීතිරීති වලට අදාලව ක්‍රීඩා කිරීම සහ තමාව පාලනය කර ගැනීම කල යුතුය.

### * 1 - 2 ආධුනික තත්වය

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු මෙන් ගොල්ෆ් තරඟ වලට සහභාගි වීම සඳහා සුදුසුකම් ලැබීමට විශව මට්ටමින් ආධුනික තත්වය පවතී. මෙම නීතිරීති උල්ලංඝනය වන අයුරින් කටයුතු කරන පුද්ගලයකුට ආධුනික තත්වය අහිමි වන අතර සහ එහි ප්‍රතිඵලයක් ලෙස ආධුනික තරඟ වලට සහභාගි අවස්ථාව අහිමි වෙයි.

### * 1 - 3 නීතිරීති වල අරමුණ

නීතිරීති වල අරමුණු සහ පිවය ආධුනික ගොල්ෆ් සහ වෘත්තීය මට්ටමේ ගොල්ෆ් අතර වෙනස පවත්වාගෙන යාම සහ චෝදනා ආදියෙන් ආධුනික ක්‍රීඩාව හැකි තරම් නිදහස්ව පවත්වා ගැනීමයි. ඇතැම් විට පැමිණිය හැකි , පාලනය කල නොහැකි අනුග්‍රහය සහ මුදල් ඇතුළු වීමෙන් ආරක්ෂා කර ගැනීමයි. ආධුනික ගොල්ෆ් සුරක්ෂිත කිරීම උවමනා වන්නේ ක්‍රීඩායට අදාල නීතිරීති සහ දක්ෂතා ලකුණු විධිමත් පවත්වා ගැනීම නිසා ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයින් හට සම්පූර්ණ ලෙස වින්දනයක් ලබා ගත හැකි වීමයි.

***   1 - 4 නීතිරීති වලට සැකය**

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු වීමට බලාපොරොත්තු වන ඕනෑම කෙනෙකු ඒ ගැන අනුමත කරන ලද පාඨමාලාවක් කිරීමට නීතිරීති යටතේ අවසරය තිබෙනවාද, යන සැකයක් ඇත්නම් පාලන සංගමය වෙතින් උපදෙස් ලබා ගත යුතුය. ආධුනික ගොල්ෆ් තරඟාවලියක ඕනෑම සංවිධායක වරයකු හෝ අනුග්‍රාහකයකු , තම තරඟාවලිය සම්බන්ධ නීතිරීති ගැන එකඟතාවයක් තිබෙනවාද, යන සැකයක් ඇත්නම් පාලන සංගමය වෙතින් උපදෙස් ලබා ගත යුතුය.

## නීතිය 2 වෘත්තිය මට්ටම

***   2 - 1 පොදු**

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු , වෘත්තිය මට්ටමේ ගොල්ෆ් ක්‍රීඩකයකු වීම සඳහා ක්‍රියාකාරී පියවරක් නොගත යුතු අතර ලිඛිත හෝ වාචික එකඟතාවයකට ඇතුලු වීමක් අනුග්‍රාහක හෝ වෘත්තිය ඒජන්තවරයකු සමග නොකිරීමද, ඇතුලත්ය.

වෙනත් - සභය වෘත්තිය ක්‍රීඩකයකු ලෙස සාර්ථක නොවන ඉල්ලීමක් කිරීම.

සටහන -ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු වෘත්තිය මට්ටමට පැමිණීම සඳහා ඔහු සතුව තිබෙන අවස්ථා ගැන සොයා බලා වෘත්තිය වැඩමුළුවක නිරතව වැටුපක් උපයා ගත හැකි වුවත් එය නීතිරීති උල්ලංඝනය නොවන සේ සිදු විය යුතුය.

***   2 - 2 වෘත්තිය ගොල්ෆ් ක්‍රීඩකයින්ගේ සංගම්**

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු වෘත්තිය ගොල්ෆ් ක්‍රීඩකයාන්ගේ සංගමයක සාමාජිකත්වය ලබා ගැනීම හෝ එය පවත්වා ගැනීම නොකල යුතුය.

***   2 - 3 වෘත්තිය තරඟ ක්‍රීඩකයින්**

වෘත්තිය ගොල්ෆ් චාරිකාවක සුදුසුකම් ලැබීමේ තරඟවලියක් හෝ අවසාන තරඟයක් සඳහා ඉල්ලුම් නො කල යුතුය.

සටහන - ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු සුදුසුකම් ලැබීමේ තරඟාවලියක් හෝ අවසාන තරඟයකට සුදුසුකම් ලැබීමේ පූර්ව තරඟයක් සඳහා ඇතුලු වුවද, තමාගේ ආධුනික තත්වය අත්හිටුවා නොගත යුතුය.

## නීතිය 3 - ත්‍යාගයන්

අර්ථයන්

ඕනෑම රටක ආධුනික තත්වය වෙනුවෙන් නීතිරීති ගැන පාලන සංගමය එම රටේ ජාතික සංගමය වේ.

සටහන - සාන්ත ඇන්ඩෘස්හි රාජකීය සහ ගොල්ෆ් සමාජය මහා බ්‍රිතාන්‍ය සහ අයර්ලන්තයේ පාලන සංගමය වේ.

තෑගි වවුචරය යනු තරඟාවලියක් භාරව සිටින කමිටුවක් විසින් වෘත්තිය සාප්පුවකින් හෝ වෙනත් මිලදී ගැනීමේ ස්ථානකින් බඩු මිලදී ගැනීමට නිකුත් කරනු ලබන්නකි.

සිල්ලර අගය යනු ත්‍යාගයක සාමාන්‍ය අලෙවි මිල වේ. මෙය අනුමත කොට තිබෙන මිලදී ගැනීමට හැකි දෙයකි.

සංකේත ත්‍යාගය යනු රන් , රිදී , පිඟන් විදුරු හෝ එවැනි සමාන දෙයකින් ස්ථිර හා කාවද්දා තිබෙන ගුරුතාවකි.

විශේෂ සම්මානය පිරි නමනු ලබන්නේ විශේෂ දස්කම් හෝ ක්‍රීඩාවට කළ දායකත්වය වෙනුවෙනි. මෙය මුදල් සම්බන්ධ ත්‍යාගයක් නොවේ.

* 3 - 1 ත්‍යාග මුදලට ක්‍රීඩා කිරීම.

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු ත්‍යාග මුදල් වෙනුවෙන් ගොල්ෆ් ක්‍රීඩා නොකල යුතුය.

* 3 - 2 ත්‍යාග සීමාවන්

(අ) පොදු

පහත සඳහන් සිල්ලර අගය සීමාවන් වලට වඩා ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු ත්‍යාගයක් (සංකේත ත්‍යාගයක් හැර) හෝ ත්‍යාග වවුචරයක් ලබා නොගත යුතුය. ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු ඕනෑම තනි තරගාවලියක් හෝ තරගාවලි කිහිපයක් වෙනුවෙන් ලබා ගන්නා සම්පූර්ණ ත්‍යාග හෝ තෑගි වවුචර් වලට මෙම සීමාවන් බල පවත්වයි. නමුත් හෝල් ඉන් වන් ප්‍රයිස් හැර.

යුරෝපයේදී - පවුම් 300 හෝ වටිනාකමින් සමවූ
වෙනත් - එක්සත් ජනපද ඩොලර් 500 හෝ වටිනාකමින් සම වූ හෝ පාලන සංගමය විසින් තීරණය කරනු ලබන එවැනි අඩු ප්‍රමාණයක්.

(ආ) හෝල් ඉන් වන් ත්‍යාග

නීතිය 3-2 යටතේ සඳහන් වන සීමාවන් හෝල් ඉන් වන් ත්‍යාග සඳහා බල පවත්වයි. නමුත් එකම තරගාවලියකදී ලැබෙන ත්‍යාගයකට අමතරව තවත් ත්‍යාගයක් ලබා ගත හැකිය.

(ඇ) ත්‍යාග හුවමාරුව

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු ත්‍යාගයක් හෝ තෑගි වවුචරයක් මුදල් වලට හුවමාරු නොකර ගත යුතුය.

වෙනත් - ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු තෑගි වවුචරයක් ජාතික හෝ ප්‍රාන්ත සංගමයක් වෙත ඉදිරිපත් කොට සහ ගොල්ෆ් තරගාවලියකට සහභාගී වීම සඳහා වියදම් වූ මුදල එමගින් ගෙවා දැමිය හැකිය. නීතිය 4-2 යටතේ මෙවැනි වියදම් (අනුමත කෙරෙන) ගැන සඳහන්ව ඇත.

සටහන 1 - අදාල ත්‍යාගයක සිල්ලර අගය නම් කිරීම තරගාවලිය භාරව සිටින කමිටුව සතු වේ.

සටහන 2 - හැම කාණ්ඩයකම දක්ෂතා ත්‍යාග හෝ සෙසු ත්‍යාග වල වටිනාකම හෝල් 18 ක තරගාවලියකදී සඳහන් වන සීමාවට දෙගුණයක් ඉක්මවා නොයන පරිදි, හෝල් 36 ක තරගාවලියකදී තුන් වතාවක් , හෝල් 54 ක තරග වලදී හතර වතාවක් ඉක්මවා නොයා යුතුය.

* 3 - 3 විශේෂ උපහාර සම්මාන

(අ) පොදු

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු නීතිය 3-2 අ සඳහන් සීමා වලට වඩා සිල්ලර අගය සහිත විශේෂ උපහාර සම්මානයක් ලබා නොගත යුතුය.

(ආ) මල්ටිපල් සම්මාන

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකුට විවිධ ප්‍රදානය කරන්නන් වෙතින් එක විශේෂ උපහාර සම්මානයකට වඩා ලබා ගත හැකි අතර ඒවායේ සිල්ලර අගය ඉක්මවා ගියද , තනි සම්මානයක් වෙනුවෙන් පවතින සීමාව ඉක්මවා නොයන පරිදි ප්‍රදානය කල යුතුය.

## නීතිය 4 - වියදම්

අර්ථයන්

පාලන සංගමය යනු ඕනෑම රටක ආධුනික තත්වය වෙනුවෙන් නීතිරීති ගැන එම රටේ ජාතික සංගමය වේ.

සටහන - සාන්ත ඇන්ඩෲස්හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජය මහා බ්‍රිතාන්‍ය සහ අයර්ලන්තයේ පාලන සංගමය වේ.

කනිශ්ඨ ගොල්ෆ් ක්‍රීඩකයා යනු තරගාවලියකට පෙර තමාගේ 18 වැනි උපන් දිනය සම්පූර්ණ නොකල කෙනෙකු වුවද පාලන සංගමය යොදා ගන්නා වෙනත් වයස් සීමාවක් ඇතුලත් විය හැකිය.

✻ 4 - 1 පොදු

නීතිරීති වල සඳහන් වනවා හැර ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු මුදලින් හෝ වෙනත් ක්‍රමයකින් , ඕනෑම කණ්ඩායමක් වෙතින් ගොල්ෆ් තරගාවලියක් හෝ ප්‍රදර්ශන තරග වෙනුවෙන් වියදම් ලබා නොගත යුතුය.

✻ 4 - 2 වියදම් කුවිතාන්සිය

ගොල්ෆ් තරගාවලියක් හෝ ප්‍රදර්ශන තරග වෙනුවෙන් ක්‍රීඩා කිරීම සඳහා නියමිත වියදම් ඉක්මවා නොයන පරිදි ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකුට වියදම් පහත සඳහන් ආකාරයට ලබා ගත හැකිය.

(අ) පවුලේ සහය

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකුට තමාගේ පවුලේ සාමාජිකයකු හෝ නීතිමය භාරකරුවකු ගෙන් වියදම් ලබා ගත හැකිය.

(ආ) කනිශ්ඨ ගොල්ෆ් ක්‍රීඩකයාන්

කනිශ්ඨ ගොල්ෆ් ක්‍රීඩකයකු තරගාවලියකට සහභාගි වන විටදී , අදාල වියදම් කනිශ්ඨ ක්‍රීඩකයකුට නියමිත සීමාවක් යටතේ ලබා ගත යුතුය.

(ඇ) කණ්ඩායම් තරඟ

(1) ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු තමාගේ රට , ප්‍රාන්තය හෝ සමාජය , (වෙනත් සංගමයක්) කණ්ඩායම් තරගාවලියකදී නියෝජනය කරන විට හෝ පුහුණු කඳවුරකදී ලබා ගැනීම : හෝ

(11) ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු , තමාගේ රට නියෝජනය කරමින් , එතෙර රටක තරගාවලියකට සහභාගි වන විට , පෙර හෝ පසුව ඉක්මණින් වියදම් ලබා ගත හැකිය.

මෙම වියදම් ඔහු නියෝජනය කරන සංගමය හෝ තරගාවලිය පවත්වන සංගමය වෙතින් ගෙවිය යුතුය.

(ඈ) තනි තරඟ

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු තනි තරග වලට සහභාගි වන විට වියදම් ලබා ගත යුත්තේ පහත සඳහන් ක්‍රම වලට අනුව සුදුසු පරිදිය.

(1) තරගාවලියට සහභාගි වීම සඳහා ක්‍රීඩකයාව ඔහුගේ සමාජය , ප්‍රාන්තය හෝ ජාතික සංගමය විසින් නම් කිරීම.

(11) තරගාවලිය ක්‍රීඩකයාගේ රටේම පැවැත්වෙනවා නම් , සහ ක්‍රීඩකයාව නම් කිරීම සමාජයක් හෝ ප්‍රාන්ත සංගමයක් විසින් කරනු ලබන විටදී , අදාල ජාතික සංගමයේ හෝ තරඟාවලිය පවත්වන ප්‍රදේශයේ ප්‍රාන්ත සංගමය වෙතින් පළමුව අනුමැතිය ලබා දීම.

(111) තරඟාවලිය වෙනත් රටක පැවැත්වෙනවානම් , එම රටේ ජාතික සංගමය වෙතින් අනුමැතිය ලබා ගැනීම සහ නම් කිරීම කරනු ලබන සංගමය එරට ජාතික සංගමය නොවන විට පළමුව උවමනා අනුමැතිය නියමිත ජාතික සංගමය වෙතින් ලබා ගැනීම.

(IV) ක්‍රීඩකයාව නම් කරනු ලබන ජාතික සංගමය හෝ ප්‍රාන්ත සංගමය විසින් පමණක් වියදම් ගෙවිය යුතු අතර හෝ නම් කරනු ලබන සංගමයේ අනුමැතියට හේතු වන අතර ක්‍රීඩකයා සංචාරය කරන ප්‍රදේශයේ සංගමයට එය අදාල වේ.

(V) ක්‍රීඩකයාව නම් කරනු ලබන පාලන සංගමය විසින් එක අවුරුද්දක් වෙනුවෙන් නියමිත තරඟ දින ගණන සඳහා වියදම් සීමා කිරීමක් කල යුතුය. මෙම වියදම් අතරට පිළිගත් ගමන් කාලය සහ පුහුණු වීම් කරන දවස් , තරඟ පවත්වනු ලබන දින ගණන අදාලව ඇතුලත් කල යුතුය.

(ඕ) විශේෂ වෙළඳ ආදිය

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකුට හේතු සඳහන් නොවන තරඟාවලියකට සහභාගී වීම සඳහා ආරාධනාවක් ලැබුනොත් ( ගොල්ෆ් හැකියාවට අදාල නැති ) වියදම් ලබා ගත හැකිය.

(ඊ) ප්‍රදර්ශන තරඟ

පිළිගත් සමාජ සේවාවක ආධාරය වෙනුවෙන් පවත්වනු ලබන ප්‍රදර්ශන තරඟයකට සහභාගිවන ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකුට වියදම් ලබා ගත හැකි අතර එම ප්‍රදර්ශන තරඟය වෙනත් ගොල්ෆ් තරඟයක් සමග එකට පවත්වා ගෙන නොයා යුතුය.

(උ) අනුග්‍රාහක දක්ෂතා තරඟාවලි

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකු අනුග්‍රාහක හැන්ඩිකැප් ගොල්ෆ් තරඟාවලියකට සහභාගී වන විට වියදම් ලබා ගත යුත්තේ එම තරඟාවලිය පහත සඳහන් අන්දමට අනුමතව තිබියදීය.

(1) මෙම තරඟාවලිය ක්‍රීඩකයාගේ රටේ පැවැත්වීමට නියමිත අතර තරඟාවලියට පෙර පාලන සංගමය වෙතින් වාර්ෂික අනුමැතිය අනුග්‍රාහකයා විසින් පළමුව ලබා දිය යුතු වීම සහ

(11) මෙම තරඟාවලිය එක රටකට වඩා ස්ථානවල පවත්වනු ලබන හෝ වෙනත් රටකින් ගොල්ෆ් ක්‍රීඩකයින් සහභාගීවන , තරඟාවලියට පෙර පාලන සංගම් දෙකක් හෝ වැඩි ගණනකින් අනුග්‍රාහකයා විසින් පළමුව අනුමැතිය ලබා ගැනීම. තරඟාවලිය ආරම්භ වන රටේ පාලන සංගමය වෙත අනුමැතිය සඳහා උවමනා අයදුම් පත්‍රය යැවිය යුතුය.

## නීතිය 5 - උපදෙස්

අර්ථයන්

ගොල්ෆ් ක්‍රීඩා කරන ශාරීරික තත්වයන් ,උපදෙස් , වලට ඇතුලත්ය. උදාහරණ : ක්‍රීඩා පිති පුහුණු පහර කිරීම සහ ගොල්ෆ් පන්දුවට පහර දීම.

කනිෂ්ට ගොල්ෆ් ක්‍රීඩකයා යනු තරඟාවලියකට පෙර තමාගේ 18 වැනි උපන් දිනය සම්පූර්ණ නොකල කෙනෙකි. පාලන සංගමයක් යොදා ගන්නා වයස බල පවත්වයි.

* 5 - 1 පොදු

නීතිරීති වල සඳහන් පරිදි හැර , ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකු ලබා දීම වෙනුවෙන් ගෙවීමක් හෝ වන්දියක් ලබා නොගත යුතුය.

* 5 - 2 ගෙවීම වලංගු වීම

(අ) පාසල් විද්‍යාල ආදිය

අධ්‍යාපන ආයතනයක හෝ ක්‍රමයක සේවයේ යෙදී සිටින ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකු හට එම අධ්‍යාපන ආයතනය හෝ ක්‍රමයේ සිසුන්ට ගොල්ෆ් ක්‍රීඩාව ගැන උපදෙස් ලබා දීම වෙනුවෙන් ගෙවීමක් හෝ වන්දියක් ලබා ගත හැකි අතර අවුරුද්දක් තුල ගොල්ෆ් ක්‍රීඩාවට උපදෙස් ලබා දෙන සම්පූර්ණ කාලය , එම ආයතනයේ සේවකයෙකු ලෙස ඉටු කරන සියලුම වගකීම් වලට සියයට 50 කට වඩා අඩුවෙන් සිදු විය යුතුය.

(ආ) කනිශ්ට ගොල්ෆ් ක්‍රීඩකයින්

පාලන සංගමය විසින් කල්තියා අනුමත කරනු ලබන වැඩසටහනක කොටස් ලෙස කනිශ්ට ගොල්ෆ් ක්‍රීඩකයින්ට උපදෙස් ලබා දීම වෙනුවෙන් , නියම වියදම් ඉක්මවා නොයන පරිදි වියදම් ලබා ගැනීම ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකුට කල හැකිය.

## * 5 - 3 ලිඛිත උපදෙස් (ලියන ලද )

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකු ලිඛිත උපදෙස් ලබා දීම වෙනුවෙන් ගෙවීමක් හෝ වන්දියක් ලබා ගත හැකි වුවත් ඔහුගේ හැකියාව හෝ කීර්තිය මත මිස ඔහුගේ රැකියාව හෝ ව්‍යාපාරික තත්වය ප්‍රධාන කොට නොවේ.

සටහන - ගොල්ෆ් නීතිරීති හෝ ක්‍රීඩාවට අදාල මානසික තත්වයන් උපදෙස් මගින් ආවරණය නොවේ.

# නීතිය 6 - ගොල්ෆ් හැකියාව සහ කීර්තිය භාවිතා කිරීම

අර්ථයන්

සාමාන්‍යයෙන් ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු සතු ගොල්ෆ් හැකියාව අනුමත කරනු ලබන්නේ ඔහු විසින් ප්‍රාන්ත හෝ ජාතික මට්ටමින් ලැබූ නියෝජනයක ගෞරවයන් මගිනි. ගොල්ෆ් කීර්තිය ලබා ගත හැක්කේ ගොල්ෆ් හැකියාව මත පමණක් වන අතර සහ පාලන බලධාරියකු ලෙස ගොල්ෆ් ක්‍රීඩාවට කල සේවය වෙනුවෙන් නොවේ. ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකුට ගොල්ෆ් හැකියාව හෝ කීර්තිය තිබෙනවාද යන්න ගැන තීරණය කිරීම පාලන සංගමය සතු කාර්යයකි.

ඕනෑම රටක ආධුනික තත්වය වෙනුවෙන් නීතිරීති ගැන පාලන සංගමය එම රටේ ජාතික සංගමය වේ.

සටහන - සාන්ත ඇන්ඩෘස් හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජය මහා බ්‍රිතාන්‍ය සහ අයර්ලන්තයේ පාලන සංගමය වේ.
ගොල්ෆ් ක්‍රීඩාකරන ශාරීරික තත්වයන් "උපදෙස් " වලට ඇතුලත්ය. උදාහරණ: ගොල්ෆ් ක්ලබ් ස්වින්ග් කිරීම සහ ගොල්ෆ් පන්දුවට පහර දීම.

## * 6 - 1 පොදු

නීතිරීති වල සඳහන් පරිදි හැර ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු තමාගේ හැකියාව හෝ කීර්තිය , ප්‍රවරක ප්‍රවර්ධනය හෝ විකිණීම තුලින් මුදල් උපයා ගැනීමට භාවිතා නොකල යුතුය.

## * 6 - 2 නාමය සහ කැමැත්ත ලබා දීම.

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු තමාගේ හැකියාව සහ කීර්තිය , ගෙවීමක් , වන්දියක් පෞද්ගලික ලාභයක් හෝ මුදල් ලබා ගැනීමක් වෙනුවෙන් තමාගේ නාමය සහ කැමැත්ත ප්‍රචාරය හෝ විකිණීම සඳහා භාවිතා නොකල යුතුය.

සටහන - ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකුට ප්‍රචාරක කටයුතු වලට සම්බන්ධ නොවී උපකරණ සම්බන්ධ කටයුතු කරන කෙනෙකුගෙන් උපකරණ ලබා ගත හැකිය.

## * 6 - 3 පෞද්ගලික ඉදිරිපත්වීම

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකු තමාගේ හැකියාව සහ කීර්තිය , ගෙවීමක් , වන්දියක් පෞද්ගලික ලාභයක් හෝ මුදල් ලබා ගැනීමක් වෙනුවෙන් පෞද්ගලිකව ඉදිරිපත් වීම නොකල යුතුය.

වෙනත් - ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයකුට ගොල්ෆ් තරගාවලියක් හෝ ප්‍රදර්ශන තරගයකට සම්බන්ධ නොවී පෞද්ගලික ඉදිරිපත් වීමක් සඳහා නියමිත වියදම් ලබා ගත හැකිය.

* 6 - 4 ගුවන් විදුලි ප්‍රචාරය සහ ලිවීම.

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකු තමාගේ හැකියාව සහ කීර්තිය ගෙවීමක් , වන්දියක් , පෞද්ගලික ලාභයක් හෝ ඕනෑම මුදල් ලබා ගැනීමක් වෙනුවෙන් ගුවන් විදුලි ප්‍රචාරය හෝ ගොල්ෆ් ලිපි ලිවීම හෝ පොත් ලිවීම හෝ නොකල යුතුය.

වෙනත් - ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකුට ගෙවීමක් , වන්දියක් ,හෝ ඕනෑම මුදල් ලබා ගැනීමක් වෙනුවෙන් ගුවන් විදුලි ප්‍රචාරය හෝ ලිවීම කල හැක්කේ :

(අ) ක්‍රීඩකයා විස්තර කථනයේ , ලිපි හෝ පොත් වල සැබෑ කතු වරයා නම් ; සහ

(ආ) ගොල්ෆ් ක්‍රීඩා කරන උපදෙස් ඇතුලත් නොවේ නම් පමණි.

* 6 - 5 දීමනා , ශිෂ්‍යත්ව සහ මුදල්

හැකියාව හෝ කීර්තිය සතු ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකු දීමනා , ශිෂ්‍යත්ව හෝ මුදල් ලබා ගැනිම නොකල යුතු අතර පාලන සංගමය විසින් අනුමත කොට තිබෙන කොන්දේසි සහ තත්වයන් යටතේ පමණි.

* 6 - 6 සාමාජිකත්වය

හැකියාව හෝ කීර්තිය සතු ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකු , ගොල්ෆ් සමාජයක සාමාජිකත්වයක් , එම සාමාජිකත්වය වෙනුවෙන් සම්පූර්ණ ගෙවීමකින් තොරව , එම සමාජයට ක්‍රීඩා කිරීම වෙනුවෙන් කෙරෙන සාමාජිකත්වය භාර නොගත යුතුය.

## නීතිය 7 - ආධුනිකත්වයට විරුද්ධ වෙනත් ක්‍රියා

අර්ථයන්

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයා මුදල් උපයා ගැනීමේ පරමාර්ථය ඇතිව ක්‍රීඩා නොකරන අතර සහ ගොල්ෆ් ක්‍රීඩාව ඉගැන්වීම සඳහා මුදල් අය නොකරන හෝ වෙනත් කාර්යයන් වෙනුවෙන් මුදල් ලබා නොගන්නා කෙනෙකි. මෙය නීතිරීති වල සඳහන් පරිදිය.

නීතිය හෝ නීතිරීති යන්න ආධුනික තත්ව වෙනුවෙන් පාලන සංගමය විසින් අනුමත කොට ඇත.

* 7 - 1 ගොල්ෆ් වලට අලාභදායී ක්‍රියා

ගෝල්ෆ් ක්‍රීඩාවේ තත්වයන්ට අලාභදායී හෝ අවැඩ සිදුවන ක්‍රියාවක් ආකාරයට ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකු ක්‍රියා නොකල යුතුය.

* 7 - 2 නීතිරීති වල පරමාර්ථය හා ජීවයට විරුද්ධ ක්‍රියා

නීතිරීති වල පරමාර්ථය හා ජීවයට විරුද්ධ වන ගොල්ෆ් ඔට්ටු තැබීම් වැනි ක්‍රියාවන් , ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකු විසින් නොකල යුතුය.

## නීතිය 8 - නීතිරීති ක්‍රියාත්මක කිරීමේ පිළිවෙල

අර්ථයන්

පාලන සංගමයකට අනුබද්ධව කමිටුව පවතී. ඕනෑම රටක ආධුනික තත්වයන් වෙනුවෙන් නීතිරීති ගැන පාලන සංගමය එම රටේ ජාතික සංගමය වේ. සටහන : සාන්ත ඇන්ඩෘස්හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජය මහා බ්‍රිතාන්‍ය සහ අයර්ලන්තයේ පාලන සංගමය වේ.

* 8 - 1 උල්ලංඝනය වෙනුවෙන් තීරණය

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකු නීතිරීති උල්ලංඝනය කල බවට කමිටුව වෙත අවධානය යොමු වුවහොත් , එවැනි උල්ලංඝනයක් සිදු වී තිබෙන බවට තීරණය කිරීම කමිටුව සතු වේ. හැම උල්ලංඝනය කිරීමක් ගැනම නිසි පරිදි පරීක්ෂනය කිරීම කමිටුව සතු බලතල අනුව සිදු වේ. කමිටුවේ තීරණය අවසාන එකක් ලෙස සැලකෙන අතර නීතිරීති වලට අදාලව ඉල්ලීමක් කල හැකිය.

* 8 - 2 ක්‍රියාත්මක කිරීම .

නීතිරීති උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් ගන්නා තීරණයක් මත කමිටුව විසින් අදාල පුද්ගලයාගේ ආධුනික තත්වය අහෝසි කිරීම හෝ නැවත ආධුනික තත්වය ලබා ගැනීමට තිබෙන තත්වයන් සම්බන්ධ ඇතැම් ක්‍රියවෙන්ගෙන් වැලකී සිටීම හෝ අත්හිටු වීම ගැන අදාල පුද්ගලයාගෙන් ඉල්ලා සිටීම කෙරේ.

නීතිය 8-2 යටතේ ගන්නා පියවර ගැන අදාල පුද්ගලයාට මෙන්ම ඒ ගැන උනන්දු වන ගොල්ෆ් සංගමයට දැනුම් දීම සඳහා කමිටුව විසින් උපරිම පියවර භාවිතාකල යුතුය.

* 8 - 3 ඉල්ලීම් පිළිවෙල

මෙම නීතිරීති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සාන්ත ඇන්ඩෲස්හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජයේ ආධුනික තත්ව කමිටුව ගත් තීරණයක් බල පවත්වන පුද්ගලයෙකු විසින් ඒ ගැන ඉල්ලීමක් ආධුනික තත්ව ඉල්ලීම් කමිටුව වෙත ඉදිරිපත් කල යුතුය.

සටහන - ආධුනික තත්වය අහෝසි කිරීම වෙනුවෙන් ගත් තීරණයක් ගැන කිසියම් පුද්ගලයෙකු හට ඉල්ලීමක් කිරීමට හැකිවන පරිදි හැම පාලන සංගමයක් විසින් නිසි ක්‍රියා පිළිවෙලක් සකස් කල යුතුය.

## නීතිය 9 - ආධුනිකත්ව තත්වය නැවත පිහිටුවීම

අර්ථයන්

පාලන සංගමයකට අනුබද්ධව කමිටුව පවතී. ඕනෑම රටක ආධුනික තත්වය වෙනුවෙන් නීතිරීති ගැන පාලන සංගමය එම රටේ ජාතික සංගමය වේ. සටහන : සාන්ත ඇන්ඩෲස්හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජය මහා බ්‍රිතාන්‍ය සහ අයර්ලන්තයේ පාලන සංගමය වේ.

* 9 - 1 පොදු

මෙහි නීතිරීති වල සඳහන් වන පරිදි කෙරෙන ඉල්ලීමක් සලකා බලා ආධුනික තත්වය නැවත පිහිටුවීම හෝ එය නොකිරීම තනි බලය කමිටුව සතුය. නැවත පිහිටුවීම ගැන ඉදිරිපත් වන හැම ඉල්ලුම් පත්‍රයක්ම එහි තත්වය මත සලකා බලනු ලැබේ.

* 9 - 2 නැවත පිහිටුවීමට ඉල්ලුම් පත්‍ර

නැවත පිහිටුවීමට ඉල්ලුම් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් කමිටුව පහත සඳහන් ප්‍රතිපත්ති මත කටයුතු කරනු ලැබේ.

(අ) නැවත පිහිටුවීමට බලාපොරොත්තු වීම

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකුට වඩා වෘත්තීය ක්‍රීඩකයෙකුට වාසි දායක තත්වයක් තිබෙන්නේ ඔහු තමාගේ වෘත්තීය ලෙස ක්‍රීඩාවට කැපවී සිටින නිසාය. නීතිරීති උල්ලංඝනය කරන වෙනත් පුද්ගලයින්ටත් , ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකුට වඩා වාසි හිමි වේ. එවැනි ක්‍රීඩකයින්ට පවතින වාසි අහිමි වීම බොහෝදුරට සිදු නොවේ. එබැවින් ආධුනික තත්වය නැවත ලබා ගැනීමට ඉල්ලුම් කරන කෙනෙකුට කමිටුව විසින් නිර්දේශ කරනු ලබන කාලයක් පිහිටුවීම වෙනුවෙන් බලා සිටීමට සිදුවනු ඇත.

නැවත පිහිටුවීම ආරම්භ වන කාලය , නීතිරීති උල්ලංඝනය කල අවසාන වතාවට සම්බන්ධ දිනට වන අතර කෙසේ වෙතත් එම පුද්ගලයාගේ අන්තිම උල්ලංඝනය කමිටුව වෙත දැනගැනීමට ලැබුණු දිනය නැවත පිහිටුවීම සම්බන්ධයෙන් තීරණය කිරීම කමිටුව සතු වේ.

(ආ) නැවත පිහිටුවීම සම්බන්ධ කාලය

(1) වෘත්තීය මට්ටම

නැවත පිහිටුවීමට කාලය සාමාන්‍යයෙන් එම පුද්ගලයා විසින් උල්ලංඝනය සිදු කල කාලයට බල පවත්වයි. නමුත් කිසිම ඉල්ලුම් කරුවෙකු නැවත පිහිටුවීමට සුදුසුකම් ලැබීම සිදු වන්නේ ඔහු විසින් අඩු තරමින් අවුරුද්දක කාලයක් නීතිරීති වලට අනුව ක්‍රියා කල පසුවය.

කමිටුව විසින් පහත සඳහන් වන කාලයන් පිළිබඳව පෙන්නුම් කිරීම නැවත පිහිටුවීම සඳහා සැලකිල්ලට ගනු ලැබේ.

| උල්ලංඝන කාලය | නැවත පිහිටුවීමට අදාල කාලය |
|---|---|
| අවුරුදු 2 කට අඩු | අවුරුද්දක් |
| අවුරුදු 2 - 10 | අවුරුදු 2ක් |
| අවුරුදු 10 ට වැඩි | අවුරුදු 3 ක් |

මෙම කාලයන් දීර්ඝ කිරීම හෝ අඩු කිරීම කමිටුව සතු අයිතියකි. අවුරුදු පහකට වඩා උල්ලංඝනය කිරීම් වලට සම්බන්ධ වන ජාතික මට්ටමේ ක්‍රීඩකයින්ට සාමාන්‍යයෙන් නැවත පිහිටුවීමට සුදුසුකම් නැත.

(11) වෙනත් නීතිරීති උල්ලංඝන.

නැවත පිහිටුවීමට බලපාන කාලය උල්ලංඝනයට අදාල බරපතලකම මත තීරණය කෙරේ.

උදාහරණ - සීමාව ඉක්මවා ගිය ත්‍යාග වටිනාකම , අනුමත නොකරන ලද වියදම් වල ප්‍රමාණය ආදිය. කෙසේ වෙතත් කිසිම ඉල්ලුම් කරුවෙකු නීතිරීති වලට අදාලව අඩු තරමින් අවුරුදු දෙකක කාලයක් වත් ක්‍රියා කරන තුරු නැවත පිහිටුවීට ඉඩක් නොලැබේ. එවැනි කාලයක් දීර්ග කිරීම හෝ අඩු කිරීම කමිටුව සතු අයිතියකි.

(111) දෙවැනි නැවත පිහිටුවීම.

නැවත පිහිටුවීමට බලපවත්වන කාලය සාමාන්‍යයෙන් අවුරුදු තුනක් වන අතර උල්ලංඝය කිරීම සම්බන්ධ නොවන පරිදිය. එවැනි කාලයක් දීර්ග කිරීම හෝ අඩු කිරීම කමිටුව සතු අයිතියකි.

(ඇ) නැවත පිහිටුවීම් ගණන

කිසියම් පුද්ගලයෙකු සාමාන්‍යයෙන් දෙවතාවකට වඩා පිහිටුවීමක් නොකෙරේ.

(ඈ) නැවත පිහිටුවන තුරු තත්වය.

නැවත පිහිටුවීම සිදු කෙරෙන කාලය තුල ඉල්ලුම් කරුවෙකු විසින් ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකුට බල පවත්වන මෙම නීතිරීති අනුගමනය කල යුතුය.

ආධුනික ගොල්ෆ් ක්‍රීඩකයෙකු ලෙස ඔහුට තරඟාවලි සඳහා ඉදිරිපත් වීමට නොහැකිය. නමුත් තමා ඇතුලත් වන සමාජයේ අනුමැතිය මත එම සමාජයේ සාමාජිකයින් අතර පවත්වනු ලබන තරඟාවලියකට ඇතුලත්ව ත්‍යාගයක් දිනා ගැනීමට ඉඩ කඩ තිබේ. නමුත් වෙනත් ගොල්ෆ් සමාජයන් සමග පවත්වන තරඟ වලට නියෝජනය කිරීමක් නොකල යුතුය.

✻ 9 - 3 ඉල්ලුම් කිරීමට පිළිවෙල

කමිටුව විසින් අනුමත කොට තිබෙන පිළිවෙලට අනුව කමිටුව බලාපොරොත්තු වන තොරතුරු සියල්ලද, ඇතුලත්ව , නැවත පිහිටුවීම සඳහා කෙරෙන ඉල්ලුම් පත්‍රයක් කමිටුව වෙත ඉදිරිපත් කල යුතුය.

✱ 9 - 4 ඉල්ලීම් පිළිවෙල (ආයාචනා )

ආධුනික තත්වය නැවත පිහිටුවීම ගැන සාන්ත ඇන්ඩෘස්හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජයේ ආධුනික තත්වයන් පිළිබඳව කමිටුව විසින් දුන් තීරණයක් සම්බන්ධයෙන් බලපෑමක් සිදුවූ පුද්ගලයෙකු , එම තීරණය ගැන නැවත ඉල්ලීමක් (ආයාචනයක්) ආධුනික තත්වයන් පිළිබඳ ආයාචනා කමිටුව වෙත ඉදිරිපත් කල යුතුය.

සටහන - ආධුනික තත්වය නැවත පිහිටුවීම ගැන ලබා දුන් තීරණයක් සම්බන්ධයෙන් සියම් බලපෑමක් සිදු වූ පුද්ගලයෙකු හට නැවත ඉල්ලීමක් (ආයාචනයක් ) කිරීමට හැකි වන පරිදි අදාල ක්‍රියා පිළිවෙලක් හැම පාලන සංගමයක් විසින්ම සකස් කොට තිබිය යුතුය.

## නීතිය 10 - කමිටුවේ තීරණය

අර්ථය

කමිටුව යනු පාලන සංගමයට සම්බන්ධ කමිටුවයි.

✱ 10 - 1 කමිටුවේ තීරණය

කමිටුවේ තීරණය අවසාන එක වේ. නමුත් නීතිරීති 8 - 3 සහ 9 - 4 අදාලව ඉල්ලීමක් කල හැකිය.

✱ 10 - 2 නීතිරීති වලට අනුමානය (සැකය)

කිසියම් කරුණක් ගැන අනුමානයක් හෝ නීතිරීති මගින් ආවරණය නොකිරීමක් ගැන කමිටුව විසින් සිතා බැලුවහොත් , ඒ සම්බන්ධයෙන් තීණයක් ගැනීමට පෙර සාන්ත ඇන්ඩෘස්හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජයේ ආධුනික තත්වයන් පිළිබඳ කමිටුව වෙතින් උපදෙස් ලබා ගත යුතුය.

## 111 කොටස - ක්‍රීඩාවේ නීතිරීති

## ගොල්ෆ් තරඟය - නීතිය 1

✱ 1 - 1 පොදු

ගොල්ෆ් තරඟයක් යනු ආරම්භක ස්ථානයේ සිට ක්‍රීඩා වලට එක පහරක් හෝ පහර කිපයකින් පන්දුව යොමු කිරීමයි. එය ක්‍රීඩාවේ නීතිරීති වලට අනුව සිදු විය යුතුය.

✱ 1 - 2 පන්දුව වෙත බලපෑමක් කිරීම

නීතිරීති වලට අදාලව හැර කිසිම ක්‍රීඩකයෙකු හෝ ක්‍රීඩා සහයකරු පන්දුවේ ස්ථානගත වීම හෝ එහි මාර්ගය වෙනස් කිරීමට බලපෑම් වන ක්‍රියාවක් නොකල යුතුය.

( මුවර්බල් ඔබ්ස්ට්‍රක්ෂන් ඉවත් කිරීම - නීතිය 24-1)

නීතිය 1-2 උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් දඬුවම තරඟය - හෝල් අහිමි වීම ,පහරදීම්- පහරදීම් දෙකක් .

සටහන - නීතිය 1-2 තදබල ලෙස උල්ලංඝනය වී ඇත්නම් , තරඟ කමිටුව විසින් තරඟයෙන් ඉවත් කල හැකිය.

* 1 - 3 නීතිරීති වලට එකඟ වීම .

තරඟ නීතිරීති ක්‍රියාත්මක කිරීම සහ දඬුවම් ක්‍රියාත්මක කිරීම ට ක්‍රීඩකයින් එකඟ විය යුතුය. ඊට එකඟ නොවීම නොකල යුතුය.

නීතිය 1-3 උල්ලංඝනය කිරීම වෙනුවෙන් දඬුවම්
තරඟය - දෙපිලම තරඟයෙන් ඉවත් කිරීම
ස්ට්‍රෝක් - තරඟකරුවන් ඉවත් කිරීම ගැන අවධානය
(ස්ට්‍රෝක් සඳහා අවස්ථාව වෙනස් කිරීමට )
එකඟතාවය වෙනුවෙන් නීතිය ( 10-2 ඇ) බලන්න.

* 1 - 4 නීතිවලින් ආවරණය නොකල කරුණු

කිසියම් අර්බුදයක් සම්බන්ධයෙන් නීතිරීති ආවරණය නොවේ නම් යුක්තිය මත තීරණයක් ගැනීම සිදුවනු ඇත.

## නීතිය 2 - ක්‍රීඩා කිරීම
## ( මැච් ප්ලේ )

* 2 - 1 හෝල් ජයග්‍රාහකයා , ගොල්ෆ් හෝල්ස් හඳුනා ගැනීම.

ක්‍රීඩා කිරීම ක්‍රීඩා වල මුල් කර ගෙන සිදු වේ. අඩු පහර සංඛ්‍යාවකින් හෝල්ස් ක්‍රීඩා කරන පිළට ජය ලැබේ. වැඩි වාසිය සැලසෙන තරඟයකදී අඩුම ලකුණු වලට ජය හිමි වේ. හෝල් හඳුනා ගැනීම සඳහා මෙම වදන් භාවිතයට ගැනේ." මෙතරම් හෝල් ක්‍රීඩා කරලා " හෝ " සියල්ල සම්පූර්ණයි " හෝ "තවත් ක්‍රීඩාකරන්නට තිබේ " "කිසියම් පිළක් මෙතරම් හෝල් ක්‍රීඩා කලා " මෙන්න මෙතරම් ක්‍රීඩා කරන්නට තිබෙනවා යන්නට " "ඩෝමී " කියා භාවිතා කෙරේ.

* 2 - 2 හෝල් සම වීම.

හැම කණ්ඩායමක්ම සමාන පහර සංඛ්‍යාවක් මගින් වල සම්පූර්ණ කිරීමයි. කිසියම් ක්‍රීඩකයෙකු හෝල් සම්පූර්ණ කල විට , ප්‍රතිවාදී ක්‍රීඩකයාට තවත් එක පහර එල්ල කිරීමට ඉතිරිව තිබේ නම් , කලින් ක්‍රීඩකයා කිසියම් දඬුවම් පමුණුවා ගතහොත් සම වීමක් සිදු වේ.

* 2 - 3 තරඟයක ජයග්‍රාහකයා (විනර්)

තරඟයක් ( නියමිත රවුන්ඩ් හෝ කමිටුව විසින් අනුමත කරන ලද ) ජයග්‍රහණය කිරීම සිදු වන්නේ , තරඟ කිරීමට තිබෙන හෝල්ස් ප්‍රමාණයටවඩා කිසියම් කණ්ඩායමක් දිනා තිබෙන හෝල්ස් ප්‍රමාණය වැඩිවන විටය. යම් තරඟයක් සමව අවසන් වීමක් වලක්වාලීමට තරඟ කමිටුව , තරඟ රවුම වෙනුවෙන් හෝල්ස් වැඩි කිරීමක් කල හැකිය. ඒ තරඟ තීරණයක් සඳහාය.

* 2 - 4 මිලඟ ස්ට්‍රෝක් , හෝල් හෝ තරඟය සම්බන්ධ වාසිය

ප්‍රතිවාදී ක්‍රීඩකයාගේ පන්දුව කිසියම් ස්ථානයක නතර වී තිබේ නම් හෝ නීතිය 16-2 අනුව පන්දුව නතර වී තිබෙන විට අනිත් ක්‍රීඩකයාට මිලඟ පහර එල්ල කිරීමට අවස්ථාව ලැබේ. එවැනි අවස්ථාවක පන්දුව ඉවත් කිරීම පිති හෝ වෙනත් ක්‍රමයකින් කල හැකිය. ක්‍රීඩකයෙකුට හෝල් ක්‍රීඩා කිරීම හෝ තරඟය ක්‍රීඩා කිරීම මුලු ක්‍රීඩා පිටිය සම්පූර්ණ කල විට කල හැකිය. මෙම වාසිය ඉවත් කිරීමට නොහැකිය.

* 2 - 5 අයිතින්

තරඟයක් අවස්ථාවේ ක්‍රීඩකයින් අතර සැකයක් හෝ අර්බුදයක් පැන නැගුනොත් ,ඒ වෙනුවෙන් ක්‍රියාකාරී වීමට තරඟ කමිටුවේ බලය ලත් නියෝජිතයෙකු විසින් ඉදිරිපත් නොවූ විට ක්‍රීඩකයින් ප්‍රමාද නොවී තරඟය පවත්වාගෙන යායුතුය. අයිතියක් පිළිබඳ ඉල්ලීමක් ඉදිරිපත් කිරීම කමිටුවේ සලකා බැලීම වෙනුවෙන් කල යුත්තේ , ඕනෑම ක්‍රීඩකයෙකු ඊළඟ ආරම්භක ස්ථානය තරඟය ඇරඹීමට පෙර හෝ තරඟයට අදාල අවසාන හෝල්ට පෙර හෝ තරඟයට සම්බන්ධ සියලුම ක්‍රීඩකයින් පටින් ග්‍රීන් මතින් ඉවත් වීමට පෙරය. කිසියම් ප්‍රමාදවී කෙරෙන ඉල්ලීමක් ගැන සලකා බැලීම සිදු වන්නේ , ක්‍රීඩකයා කලින් නොදැන සිටි කරුණු ඉදිරිපත් කල විටදී සහ ඉල්ලීම ඉදිරිපත් කල විටදීය. නිල ප්‍රථිඵල ප්‍රකාශ කල පසු ප්‍රමාදවී කෙරෙන ඉල්ලීමක් ගැන සලකා බලන්නේ කමිටුව මගින් ඒ පිළිබඳ පූර්ණ අවබෝධයකින් පසුවය.

* 2 - 6 පොදු දඬුවම .( නිත්‍ය දඬුවම් )

තරඟයකදී නීතිරීති උල්ලංඝනය කිරීම වෙනුවෙන් දඬුවම් ක්‍රීඩා වල අහිමි වීමකි. නැතිනම් වෙනත් ක්‍රමයක් මගිනි. (සලස්වා නොමැති විටදී)

## නීතිය 3 - ස්ට්‍රෝක් කිරීම

* 3 - 1 ජයග්‍රාහකයා

නියමිත තරඟ වටයක් හෝ තරඟ වට (රවුන්ඩ්ස් ) අඩුම සංඛ්‍යාවකින් ක්‍රීඩා කරන ක්‍රීඩකයා ජයග්‍රාහකයා ලෙස නම් කරනු ලැබේ.

* 3 - 2 හෝල් සම්පූර්ණ කිරීමට අසමත් වීම

ක්‍රීඩකයෙකු හෝල් සම්පූර්ණ කිරීමට අසමත් වේ නම් මීලඟ ආරම්භක ස්ථානය වලින් තරඟ ආරම්භ කිරීමට පෙර එම අඩුපාඩුව සම්පූර්ණ කිරීමට අසමත් වේ නම් හෝ අවසාන හෝල් එකෙන් (තරඟ වටය අවසන් කරන හෝල් එකට මත්තෙන් ) පටින් ග්‍රීන් වෙතින් පිටවී යාමට පෙර වරද නිවැරදි කර නැත්නම් ඔහුව තරඟයෙන් අවලංගු කරනු ලැබේ.

* 3 - 3 ක්‍රියා පිළිවෙල අනුමාන කිරීම .

(අ) ක්‍රියා පිළිවෙල

ක්‍රීඩාව කරගෙන යාමේදී ක්‍රීඩකයෙකුට තමාගේ අයිතීන් ගැන අනුමානයක් ඇතිවේ නම් දඬුවම් තොරව දෙවැනි පන්දුව ක්‍රීඩා කිරීමට ඉඩ ලැබේ. මෙවැනි අනුමාන කිරීමක් ඇති වූ විට , ක්‍රීඩකයා තව දුරටත් ක්‍රියාකාරී වීමට පෙර , ඔහු විසින් තමාගේ මාර්කර් හෝ වෙනත් ක්‍රීඩකයෙකු හට මෙම නීතිය සම්බන්ධ තමාගේ තීරණ හා නීතිය ඉඩකඩ ලබා දේ නම් ලකුණු ලබා ගන්නා පන්දුව ගැනද දැනුම් දීමක් කල යුතුය.

තමාගේ ලකුණු සටහන් පත කමිටුව වෙත භාර දීමට පෙර අදාල කරුණු ක්‍රීඩකයා විසින් වර්තා කල යුතුය. පන්දු දෙකෙන්ම එකම ලකුණු ලබා ඇතැම් ප්‍රශ්නාකාරී තත්වයක් මතු නොවේ. එසේ නොකල හොත් ඔහුව තරගයෙන් අවලංගු කරනු ලැබේ. (ඩිස්කොලිෆයිඩ්)

(ආ) ලකුණු ලබා ගැනීමට අධිෂ්ඨානය.

ක්‍රීඩකයා විසින් කල් තියාම නීතිරීති වලට අදාලව ක්‍රියා පිළිවෙල තෝරා ගත් විටදී තමා තෝරා ගත් පන්දුවෙන් ලබා ගත් ලකුණු අනුමත කෙරේ.

මෙම නීතියට අදාලව තමාගේ තීරණය ක්‍රීඩකයා විසින් කල්තියා දැනුම් නොදේ නම් හෝ ඔහුගේ තෝරා ගැනීම , නියමිත පන්දුවෙන් ලබා ගන්නා ලකුණු හෝ මුල් පන්දුව ක්‍රීඩා කරන පන්දු වලින් එකක් නොවේ නම් , තරග නීතිරීති වලට අදාලව පළමුව යොදා ගන්නා පන්දුව ගණන් ගනු ලැබේ.

සටහන 1 - ක්‍රීඩකයා දෙවැනි පන්දුවක් ක්‍රීඩා කරන විට , දඬුවම් පහරවල් ලබා ගැනීම අනුමත නොකෙරේ. පහරවල් ගණන් ගැනීම සිදු නොවේ.

සටහන 2 - නීතිය 3-3 අනුව ක්‍රීඩා කරන දෙවැනි පන්දුව නීතිය 27-2 යටතේ අතිරේක පන්දුවක් නොවේ.

* 3 - 4 නීතිය පිළි ගැනීමට අකමැත්ත.

වෙනත් ක්‍රීඩකයකුගේ අයිතීන් සම්බන්ධ නීතියකට සහය පළ කිරීමට ක්‍රීඩකයකු අකමැත්ත පළ කරයි නම් ඔහුව තරගයෙන් අවලංගු කෙරේ. (ඩිස්කොලිෆයිඩ්)

* 3 - 5 පොදු දඬුවම (පෙනල්ටි).

පහරදීමේ තරගයකදී නීතියක් උල්ලංඝනය කිරීම වෙනුවෙන් දඬුවම දඬුවම් පහර දෙකක් හෝ වෙනත් සඳහන් කර ඇති දඬුවමකි.

## ගොල්ෆ් ක්ලබ් සහ පන්දුව

ක්‍රීඩා පිති සහ පන්දු සම්බන්ධයෙන් පවතින නීතිරීති ඕනෑම අවස්ථාවක වෙනස් කිරීමේ අයිතිය සාන්ත ඇන්ඩෘස් හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජය සතුය.

## නීතිය 4 - ගොල්ෆ් ක්ලබ්ස්

ක්‍රීඩකයකු හට ක්‍රීඩා පිති එකක අනුකූල භාවය ගැන සැකයක් ඇත්නම් සාන්ත ඇන්ඩෘස් හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජය වෙතින් විමසීමක් කල යුතුය. අනුමැතිය ලබා ගැනීම සඳහා නිෂ්පාදකයකු විසින් ගොල්ෆ් පිත්තක් සාම්පලයක් රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජය වෙත ඉදිරිපත් කල යුතුය. එසේ කල යුත්තේ එය නීති වලට ආදාලව නිෂ්පාදනය වනවාද යන්න දැන ගැනීමටය. යම් විධියකින් නිෂ්පාදකයකු තම නිෂ්පාදනයට පෙර හෝ අලවියට පෙර ගොල්ෆ් ක්ලබ් සාම්පලයක් ඉදිරිපත් නොකලහොත් , එය නීතිරීති වලට අදාලව ගණන් නො ගැනීමට ඉඩකඩ තිබේ. සාන්ත ඇන්ඩෘස් හි පැරණි සහ රාජකීය ගොල්ෆ් සමාජය වෙත ඉදිරිපත් කරනු ලබන සාම්පලයක් එහි පරීක්ෂාවට යටත් වන දේපලක් බවට පත් වේ.

* 4 - 1 ක්‍රීඩා පිති නිර්මාණය

(අ) පොදු

උප ග්‍රන්ථ 11 හි දක්වා ඇති නීතියට නියමිත ප්‍රමාණයන්ට , අර්ථ කථනයන්ට ක්‍රීඩකයින්ගේ ක්‍රීඩා පිති අනුකූල විය යුතුය.

(ආ) වෙනස් කිරීම / ගෙවියාම

නීතිරීති වලට අනුකූලව අළුත් ක්ලබ් එකක් භාවිතා කිරීම එය ගෙවී ගියත් එය නීතිරීති වලට අනුකූල ක්ලබ් එකක් වේ. නැවත අළුත් වැඩියාවක් කරන්නේ නම් එය නීතිරීති වලට අනුව පිළිගැනෙන ලෙස සිදු විය යුතුය.

* 4 - 2 ක්ලබ් අංග වෙනස් කිරීම

තරග වටයක් තුලදී ක්ලබ් එකක අංගයන් වෙනස් කිරීම හෝ මාරු කිරීම නොකල යුතුය

පිටස්තර උපකරණ

ක්ලබ් එකක මුහුණත පිටස්තර උපකරණ කිසිවක් සටහන් නොකොට පන්දුවේ ගමන් මාර්ගයට බාධාවක් නොකල යුතුය.

නීතිය 4-1 හෝ 2 උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් පෙනල්ටි තරගයෙන් ඉවත් කිරීම.

* 4 - 3 හානියක් සිදුවන ක්‍රීඩා පිති නැවත සැකසීම සහ වෙනත් ක්ලබ් යොදා ගැනීම

(අ) තරගයක් අවස්ථාවේ හානිවීම.

තරග වටයක් අවස්ථාවේ ක්‍රීඩකයාගේ ක්ලබ් එකක් හානියට පත් වේ නම් :

(I) තරග වටය නමාර වන තුරු එම ක්ලබ් එක භාවිතා කිරීම.

(II) ක්‍රීඩාවට ප්‍රමාදයක් නොවන සේ ඉක්මණින් එය අලුත් වැඩියා කිරීම/කරවා ගැනීම.

(III) ක්ලබ් සම්පූර්ණ ලෙස ක්‍රීඩාවට යෙදා ගැනීමට අපහසු නම් වෙනත් පිත්තක් යොදා ගැනීම. ප්‍රමාදයකින් තොරව මෙය කල යුතු අතර වෙනත් ක්‍රීඩකයකු භාවිතා කරන පිත්තක් යොදා නොගත යුතුය.

නීතිය 4-3 (අ) උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් දඬුවම නීතිය 4-4 (අ) හෝ (ආ) දඬුවම් ප්‍රකාශය බලන්න.

සටහන - සැලකිය යුතු හානියක් සිදු වුවහොත් ක්ලබ් ක්‍රීඩාවට සුදුසු නොවේ. (උදාහරණ) පිත්තේ මුදුනත හෝ පහල කොටස කොටස් වලට කැඩියාම , සෙලවීම , ස්වරූපය වෙනස් වීම නැමීම , ලොෆ්ට් වෙනස් වීම , පිත්තේ මුහුනත සීරීම නිසා ක්ලබ් එක ක්‍රීඩාවට නුසුදුසු තත්වයට පත් නොවේ.

(ආ) ක්‍රීඩාව සඳහා යොදාගෙන නොමැති අවස්ථාවක හානියක් වීම

සාමාන්‍ය තරගයකට අදාල නොවන තරගවටයකදී ක්‍රීඩාව සඳහා යොදාගෙන නොමැති ක්ලබ් එක හානියට පත් වුණොත් වෙනත් ක්ලබ් යොදා ගැනීම හෝ හානියට පත් පිත්ත භාවිතා කිරීම කල නොහැකිය.

(ඇ) තරග වටයකට පෙර හානිය.

නීතිරීති වලට අනුකූලව හානි සිදු වී ඇති ක්ලබ් තරග වටයකට පෙර හානියට පත්වූ ක්ලබ් භාවිතා කිරීමට ක්‍රීඩකයකුට ඉඩකඩ ලැබේ. එවැනි පිත්තකට ප්‍රතිසංස්කරණ කටයුතු කළ හැකිය. තරගය පවතිද්දී තරගයට ප්‍රමාදයක් නොවන පරිදි අදාල අංග වෙනස් නොවන පරිදි එය කල යුතුය.

නීතිය 4-3 (ආ) හෝ (ඇ) උල්ලංඝනය කිරීම වෙනුවෙන් දඬුවම් තරගයෙන් ඉවත් කිරීම. (ප්‍රමාදය වෙනුවෙන් නීතිය 6-7 බලන්න)

* 4 - 4 ක්ලබ් දාහතරක (14) උපරිමය.

(අ) ක්ලබ් තෝරා ගැනීම හා එකතුව

තරග වටයක් ආරම්භ කරන විටදී ක්‍රීඩකයකු සතු ක්ලබ් (14) කට වඩා නොතිබිය යුතුය. එම වටය සඳහා තෝරා ගන්නා ක්ලබ් පමණක් තිබිය යුතුය. පිති (14) කට වඩා යොදා ගෙන නැත්නම් එය (14) දක්වා යොදා ගත හැකිය. අතිරේක ක්ලබ් යොදා ගැනීම ප්‍රමාදයකින් තොරව කල යුතුය. (නීතිය 6-7) වෙනත් ක්‍රීඩකයකු සතු පිති භාවිතා නොකළ යුතුය.

(ආ) සහකරුවන් ක්ලබ් භාවිතා කිරීම

සහය ක්‍රීඩකයින්ට අදාල පිති භාවිතා කල හැකිය. නමුත් එය පිති (14) ඉක්ම නොවිය යුතුය.

නීතිය 4-4 (අ) හෝ (ආ) උල්ලංඝනය කිරීම වෙනුවෙන් දඬුවම් වැඩිපුර පිති යොදා ගැනීම.

කිසියම් තරග වල අවස්ථාවේ උල්ලංඝනය කිරීම සිදු වුණා නම් එම තරග වල අහිමි වේ. තරග වටයක වැඩිම අහිමි වීම හෝල් දෙකකි. පහර එල්ල කිරීම පැත්තෙන් පහර දෙකක් අහිමි වේ. වැඩිම අහිමි වීම පහරවල් හතරකි.

වැඩිපුර නීතිය 32-1 (ආ) බලන්න.

(ඇ) ක්ලබ් ඉවත් කිරීම.

මෙම නීතියට අදාලව උල්ලංඝනය කිරීමකදී භාවිතා කරනු ලබන පිත්ත ඉවත් කරන අතර එය ක්‍රීඩාවට නැවත යොදා ගැනීමට ක්‍රීඩකයාට ඉඩකඩ නො ලැබේ.

නීතිය 4-4 (ඇ) උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් දඬුවම් තරගයෙන් ඉවත් කිරීම.

## නීතිය 5 ගොල්ෆ් පන්දුව

### * 5 - 1 පොදු

උපග්‍රන්ථය 111 සඳහන් වන ආකාරයට ක්‍රීඩකයකු විසින් භාවිතා කරනු ලබන පන්දුව නියමිත උවමනාවන් සපුරා තිබිය යුතුය.

සටහන - ක්‍රීඩකයා භාවිතා කරන පන්දුව අනුමත පන්දු නාමාවලියේ එකක් බව තරග කමිටුව විසින් (නීතිය 33-1) යටතේ සලකා බලනු ලැබේ.

### * 5 - 2 පිටස්තර ද්‍රව්‍ය

පන්දුවේ ස්වභාවය වෙනස් වන අයුරින් පිටස්තර කිසිම දෙයක් පන්දුවට යෙදවීම තහනම්ය.

නීතිය 5-1 හෝ 5-2 උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් දඬුවම් තරගයෙන් ඉවත් කිරීම.

### * 5 - 3 පන්දුව තරගයට සුදුසු නොවීම.

හැඩය වෙනස් වු , පුපුරා ගිය හෝ කැපී ගිය පන්දුවක් තරගයට සුදුසු නැත. පන්දුවක මඩ හෝ වෙනත් දෙයක් තැවරීම , එහි පාට වෙනස් වීම , යන්තම් ඉරි ඇතිවීම ආදිය බල පවත්වන්නේ නැත. ක්‍රීඩා කරගෙන යන අවසථාවේ ක්‍රීඩකයකු හට තමාගේ පන්දුව ක්‍රීඩා කිරීමට සුදුසු නොවන බව හැඟී ගියොත් , දඬුවමක් නොමැතිව එය ඉහලට ඔසවා පරීක්ෂාකර බැලිය හැකිය. එසේ පන්දුව ඔසවා පෙන්වීමට මත්තෙන් ක්‍රීඩකයා විසින් අනිත් ක්‍රීඩකයාට , සටහන් කරුට ඒ බව දන්වා සිටිය යුතුය. මොවුන්ට පන්දුව පරීක්ෂා කොට බැලීමටත් ඉඩකඩ සලසා දිය යුතුය.

මෙම ක්‍රියාව කිරීමට අපොහොසත් වුණොත් එක පහරක දඬුවමක් ලැබේ.
පන්දුව ක්‍රීඩා කිරීමට සුදුසු නොවන බව හැඟී ගියහොත් වෙනත් පන්දුවක් යොදා ගැනීමට ඉඩකඩ ලැබේ. නව පන්දුව තැබිය යුත්තේ කලින් පන්දුව පැවති ස්ථානයේය.

පහරදීමේදී යම් විධියකින් පන්දුව කෑලි වලට කැඩී ගියහොත් එල්ල කල පහර අවලංගු වන අතර , දඬුවමකින් තොරව වෙනත් පන්දුවක් යොදා ගෙන කලින් පන්දුව ක්‍රීඩා කළ ස්ථානයේ සිට නැවත ක්‍රීඩාව ආරම්භ කල යුතුය. (නීතිය 20-5 බලන්න.)

නීතිය 5 - 3 උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් match play දඬුවම් ක්‍රීඩා වල අහිමි වීම ,පහර දෙකක් අහිමි වීම.

සටහන - ප්‍රතිවාදී ක්‍රීඩකයා , සටහන් කරු හෝ සෙසු ක්‍රීඩකයා නුසුදුසු බව ගැන විරුද්ධ වන්නේ නම් සාකච්චා කිරීමට බලාපොරොත්තු වන්නේ නම් ක්‍රීඩකයා වෙනත් පන්දුවක් ක්‍රීඩා කිරීමට පෙර එය කල යුතුය. ( මැදූ තණ පියස මතින් ඔසවන ලද පන්දුව හෝ වෙනත් පිස දැමීම වෙනුවෙන් නීතිය 21 බලන්න.

## ක්‍රීඩකයින්ගේ වගකීම්
## නීතිය 6 - ක්‍රීඩකයා

අර්ථය - සටහන් කරු තරඟ කමිටුව විසින් පත් කරනු ලබන ක්‍රීඩකයෙකුගේ ලකුණු සටහන් කරන්නා වේ. ඔහු සහය ක්‍රීඩකයෙකු විය හැකිය. නමුත් ඔහු තරඟ විනිසුරු වරයෙකු නොවේ.

✻ 6 - 1 තරඟයක තත්වයන්

තරඟයට අදාල නීතිරීති සහ තරඟ තත්වයන් ගැන අවබෝධයක් ලබා ගැනීම ක්‍රීඩකයා සතු වගකීමකි. (නීතිය 33-1 )

✻ 6 - 2 මුලදී පමුණුවන අවාසිය

(අ) තරඟ ක්‍රීඩාව

මුලදී අවාසිය සලසන තරඟයකදී ක්‍රීඩකයින් තමන්ට ලැබෙන අවාසිය ගැන අවබෝධයක් ලබා ගත යුතුයි. මෙහි සීමාවන් ඉක්මවා යන ක්‍රීඩකයින් තරඟයෙන් ඉවත් කරනු ලැබේ. තරඟ කිරීමට ලැබෙන්නේ ඉඩ සලසන වාසිය අනුවය.

(ආ) පහර එල්ල කිරීම .

වාසිය සලසා දෙන තරඟයකදී තමාගේ ලකුණු නිසි පරිදි සටහන් කොට තරඟ කමිටුව වෙත බාරදීම ක්‍රීඩකයා විසින් කල යුතුය. යම් විධියකින් තමාට ලබා දෙන අවස්ථාවන්ට වඩා ක්‍රීඩා කොට තිබුණොත් තරඟයෙන් ඉවත් කරනු ලැබේ.

සටහන - තමන්ට ලබා දෙන හෝ ලැබෙන වාසිය මත ක්‍රීඩා කරන වල සහ අදාල පහර ගැන දැන ගැනීම ක්‍රීඩකයා සතු වගකීමකි.

✻ 6 - 3 ආරම්භය සහ කණ්ඩායම්

(අ) ආරම්භය

තරඟ කමිටුව විසින් ලබා දෙන නියමිත කාලයට තරඟය ආරම්භ කල යුතුය.

(ආ) කණ්ඩායම්

තරඟ කමිටුව විසින් සුදානම් කරනු ලබන කණ්ඩායම තුල තරඟ වටයක් තුල ක්‍රීඩකයා රැඳී සිටිය යුතුය. වෙනසක් සිදු වන්නේ කමිටුව විසින් අනුමත කල හොත් පමණි.

නීතිය 6-3 උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් දඬුවම් - තරඟයෙන් ඉවත් කිරීම. (හොඳම පන්දුව සහ පන්දු හතරක ක්‍රීඩාව නීතිය 30-3 (අ) සහ නීතිය 31-2 බලන්න. )

සටහන - තරඟයකදී කමිටුව විසින් පහත දැක්වෙන ආකාරයට (නීතිය 33-1 ) නියමිත තරඟ කාලයට අනුව පටන් ගැනීමේ වෙලාවේ සිට මිනිත්තු පහක් ඇතුලත ක්‍රීඩකයෙකු විසින් තරඟය ආරම්භ කිරීමට සැරසී පැවතියහොත් දඬුවම් වශයෙන් පළමුවැනි බිල හෝ පහර දෙකක් අහිමි වීම ලැබේ.

✻ 6 - 4 සහය කරුවා (ක්‍රීඩා සහයකරු)

ක්‍රීඩකයෙකුට සහය කරුවකු ලැබෙන්නේ එක් අයෙකු පමණි. සහයකරුවා විසින් කිසියම් නීතියක් උල්ලංඝනය කලහොත් ලැබෙන දඬුවම් ක්‍රීඩකයාට බල පවත්වයි.

✻ 6 - 5 පන්දුව

නිසි පන්දුව තෝරා ගැනීම ක්‍රීඩකයා සතු වගකීමකි. තමාගේ පන්දුවට හඳුනාගැනීමේ සළකුණක් සටහන් කිරීම ක්‍රීඩකයා විසින් කල යුතුය.

* 6 - 6 පහර එල්ල කිරීමට ලකුණු.

(අ) ලකුණු සටහන් කිරීම

හැම හෝල් අවසානයේ ක්‍රීඩකයා සමඟ සසඳා බලා සටහන් කරු විසින් ලකුණු සටහනක් තැබිය යුතුය. තරඟ වටයක් අවසානයේ ලකුණු සටහන් පත අත්සන් තබා ක්‍රීඩකයාට ලබා දිය යුතුය. යම් විධියකින් එක් සටහන් කරුවෙකුට වඩා කටයුතු කරන විටදී තමාට අදාල කොටසේ අත්සන් තැබීම සටහන් කරුවන් විසින් කල යුතුය.

(ආ) අත්සන් කිරීම සහ කාඩ් පත ලබා දීම.

හැම තරඟ වටයක් අවසානයේ ලකුණු පරීක්ෂාකර තමාට අදාල ලකුණු ගැන ප්‍රශ්ණකාරී තත්වයක් ඇත්නම් කමිටුව සමග විසඳා ගත යුතුය. කාඩ් පතේ සටහන් කරුවාගේ අත්සනත් තමාගේ අත්සනත් යොදා ඉතා ඉක්මනින් එය ක්‍රීඩකයා විසින් කමිටුව වෙත ලබා දිය යුතුය.

නීතිය 6-6 (ආ) උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් දඬුවම් - තරඟයෙන් ඉවත් කිරීම.

(ඇ) කාඩ්පතෙහි වෙනස්කම් කිරීම.

ක්‍රීඩකයා විසින් කාඩ්පත කමිටුව වෙත භාර දුන් පසුව කිසිඳු වෙනස් කිරීමක් නොකල යුතුය.

(ඈ) වල අදාල වැරදි ලකුණු

තමාගේ කාඩ් පතේ හැම වල වෙනුවෙන් සටහන් කොට තිබෙන ලකුණු වල නිවැරදිතාවය ගැන ක්‍රීඩකයා විසින් වගකිව යුතුය. යම් විධියකින් ලබා ගත් ලකුණු වලට වඩා අඩුවෙන් සටහන් කොට තිබුණොත් තරඟයෙන් ඉවත් කිරීමක් සිදු වේ. ලබා ගත් ප්‍රමාණයට වඩා ලකුණු සටහන් කොට ඇත්නම් නියමිත ලකුණු ප්‍රමාණය බල පවත්වයි.

සටහන 1 - කාඩ්පතේ සටහන් ලකුණු වල වෙනසක් කිරීම කමිටුව සතු වගකීමකි. (නීතිය 33-5 බලන්න. )

සටහන 2 - පන්දු හතරක ක්‍රීඩාවක් වෙනුවෙන් (නීතිය 31-4 සහ 7 (අ) බලන්න)

* 6 - 7 ප්‍රමාදය සහ සෙමින් ක්‍රීඩා කිරීම.

කමිටුව සඳහන් කරන පරිදි ක්‍රීඩකයා විසින් ප්‍රමාදයකින් තොරව ක්‍රීඩා කල යුතුය. තරඟ හෝල් අවසාන වූ පසු මීලඟ ආරම්භක ස්ථානයේ සිට ක්‍රීඩා කිරීම ප්‍රමාද නොකල යුතුය.

නීතිය 6-7 උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් දඬුවම -වල සහ පහර දෙකක් අහිමි වීම. .මීට අමතරව (නීතිය 32-1 (අ) , 32-1 (ආ) බලන්න. )

සටහන 1 - ක්‍රීඩාවල අතර තරඟ කිරීමේදී ප්‍රමාදයක් කල හොත් නිසි දඬුවම බල පවත්වයි

සටහන 2 - සෙමින් ක්‍රීඩා කිරීම වැලැක්වීම සඳහා තරඟ කමිටු විසින් (නීතිය 33-1අදාලව) තරඟ ඉරියව් නියමිත කාල සීමාවන් , තරඟ වටයක් නිම කල යුතු කාලය ගැන තොරතුරු ලබා දෙනු ලැබේ. කමිටුව විසින් , පහර එල්ල කිරීම වෙනුවෙන් අවස්ථාවට උචිතව මෙම නීතිය පහත සඳහන් පරිදි වෙනස් කිරීමක් කෙරේ.

පළමුවැනි උල්ලංඝනය - පහරවල් එකක්
දෙවැනි උල්ලංඝනය - පහරවල් දෙකක්
වෙනත් උල්ලංඝනයක් - තරඟයෙන් ඉවත් කිරීම.

*   6 - 8 තරඟයක් නතර කිරීම සහ නැවත ආරම්භ කිරීම

(අ) ක්‍රීඩකයෙකු විසින් තරඟයක් නතර කිරීම නොකල යුත්තේ ,

(1) තරඟ කමිටුව තරඟය නතර කරන තුරු

(11) විදුලි කෙටීම් වලින් අනතුරක්වන බවට හැඟෙන තුරු

(111) අර්බුදකාරී සැකසහිත ලකුණක් ගැන කමිටුව වෙතින් තීරණයක් ලබා ගන්නා තුරු (නීතිය 2-5 සහ 34-3)

(1V) හදිසි රෝගාතුර වීමක් වැනි අවස්ථාවකදී

අයහපත් කාලගුණය පමණක් ක්‍රීඩාව නතර කිරීමට සුදුසු කරුණක් නොවේ. තරඟයක් නතර කිරීමට කමිටුව වෙතින් අවසර ලබා ගත යුතුය. ක්‍රීඩකයා ඉදිරිපත් කරන හේතුව කමිටුව පිළිගනී නම් දඬුවම නොලැබේ. එසේ නොවුවහොත් ක්‍රීඩකයාව තරඟයෙන් ඉවත් කරනු ලැබේ.

තරඟය ප්‍රමාදවීමක් හෝ එකඟතාවක් මත ක්‍රීඩාව ප්‍රමාද වීම තරඟයෙන් අවලංගු කිරීමට හේතුවක් නොවේ.

සටහන - පිටියෙන් ඉවත්ව යාමක් තරඟය නතර කිරීමක් ලෙස නොසැලකේ.

(ආ) කමිටුව විසින් තරඟය නතර කල විට ක්‍රියා පිළිවෙල

කමිටුව විසින් තරඟය නතර කල විටදී නැවත ක්‍රීඩකයින්ට තරඟය ආරම්භ කිරීමට අවස්ථාව ලැබෙන්නේ කමිටුවේ තීරණය අනුවය. කමිටුව දැන්වූ විටදී ක්‍රීඩාවේ යෙදෙන වල සම්පූර්ණ කල වහාම තරඟය නතර කල යුතුය.

6 - 8 (ආ) නීතිය උල්ලංඝනය කිරීම වෙනුවෙන් දඬුවම - තරඟයෙන් ඉවත් කිරීම.

සටහන - තරඟ කමිටුව තරඟයට අදාල තත්වයන් සම්පාදනය කරනු ලැබේ. (නීතිය 33-1) අන්තරාදායක තත්වයන් වලදී කමිටුව දැනුම්දුන් වහාම තරඟය නතර කල යුතුය. ක්‍රීඩකයෙකු එසේ නොකලහොත් තරඟයෙන් ඉවත් කරනු ලැබේ. එසේ නැතිනම් (නීතිය 33-7) අදාලව දඬුවම වලින් නිදහස් කිරීමක් කෙරේ.

(ඇ) තරඟය නතර කල විට පන්දුව ඉවත් කිරීම.

කමිටුව විසින් තරඟය නතර කිරීමට තීරණය කල විටදී ක්‍රීඩකයාට නියමිත වල සම්පූර්ණ කල පසු පන්දුව ඉවතට ගත හැකිය. පන්දුව ඉවතට ගැනීමට පෙර එය තිබූ ස්ථානය සලකුණු කල යුතුය. කමිටුවේ තීරණයකින් තොරව පන්දුව ඉවත් කරන්නේ නම් ක්‍රීඩකයා විසින් ඒ බව කමිටුවට දැනුම් දිය යුතුය. (නීතිය 6 - 8 (අ) )

පන්දුව සලකුණු කිරීමට හෝ ඉවත් කිරීමට පෙර කමිටුවට දැන්වීමට අපොහොසත් වුවහොත් ලෙස එක පහරක් අහිමි වේ.

(ඈ) තරඟ නැවත ආරම්භ වූ විට ක්‍රියා පිළිවෙල

තරඟය නතර කල ස්ථානයේ පටන් නැවත තරඟය ආරම්භ කල යුතුය. එවිට ක්‍රීඩකයා විසින් පහත සඳහන් දේවල් අනුගමනය කල යුතුය.

(1) නීතිය 6-8 (ඇ) යටතේ පන්දුව ඉවතට ගෙන තිබේ නම් නැවත මුල් පන්දුව තිබූ ස්ථානයේම පන්දුවක් තැබිය යුතුය. නැත්නම් මුල් පන්දුව තැබිය යුතුය.

(11) මුල් ස්ථානයේ පන්දුව නැවත තැබීමට අදාලව පන්දුව පිරිසිදු කිරීම හෝ වෙනත් පන්දුවක් තැබීම කල හැකි වන්නේ (නීතිය 6-8 ඇ ) සම්බන්ධ නොවූ විටය. පන්දුව ඉවතට ගැනීමට පෙර සලකුණු කිරීම වැදගත්ය.

(111) ක්‍රීඩකයාගේ පන්දුව හෝ පන්දු සලකුණු කිරීමක් හෝ ඉවතට යාමකදී (සුළඟ හෝ ජලයෙන් ) කලින් පන්දුව තිබූ ස්ථානයේම වෙනත් පන්දුවක් හෝ සළකුණු කිරීමක් තැබිය හැකිය. (නීතිය 20-3 ඇ බලන්න. )

නීතිය 6-8 (ඈ) උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් දඬුවම - වල අහිමි වීම හෝ පහර දෙකක්.

## නීතිය 7 - පුහුණුව

අර්ථය - තරඟ පිටිය යනු ක්‍රීඩාව සඳහා නියමිත සම්පූර්ණ ප්‍රදේශයයි. (නීතිය 33-2 බලන්න.)

* 7 - 1 තරඟ වටයන්ට පෙර හා තරඟ වටයන් අතර

(අ) තරඟය - match play

තරඟාවලියක තරඟ කාලය තුල , ක්‍රීඩකයෙකු විසින් තරඟ වටයකට පෙර පුහුණුවීම් කල යුතුය.

(ආ) පහර එල්ල කිරීම

තරඟාවලියක පහර එල්ල කරන දිනවල ක්‍රීඩකයෙකු තරඟ පිටිය තුල පුහුණුවීම් කිරීම හෝ තරඟ ස්ථාන පරීක්ෂාකර බැලීම නොකල යුතුය. පිට පිට දවස් වල ක්‍රීඩා කරන විටත් තරඟ වටයන් අතර පුහුණු වීම හෝ පරීක්ෂා කිරීම නොකල යුතුය.

සටහන - තරඟ අසල තරඟ වටයක් ආරම්භ වීමට පෙර පුහුණු වීම් වලට ඉඩකඩ ලැබේ.

නීතිය 7-1 (ආ) උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් දඬුවම - තරඟයෙන් ඉවත් කිරීම.

සටහන - තරඟ තත්වයන් අනුව (නීතිය 33-1 ) අදාලව තරඟ කමිටුව විසින් පුහුණුවීම් කිරීමට හෝ තහනම් කිරීමට කටයුතු කරනු ලැබේ.

* 7 - 2 තරඟ වටයක් අවස්ථාවේ

පහරදීම් ක්‍රීඩා කරන විටදී හෝ අවසරයකින් තොරව ක්‍රීඩකයෙකුට පුහුණුවීම් වලට ඉඩ නොලැබේ. පුහුණු වීමට ඉඩකඩ ලැබුණ විටදී එය තරඟයට ප්‍රමාදයක් නොවන අයුරින් කල යුතුය. (නීතිය 6-7)

වෙනත් - කමිටුව විසින් තරඟය නතර කල විටදී නැවත තරඟය ආරම්භ කිරීමට පෙර ක්‍රීඩකයෙකු විසින් (අ) නීතියට අදාලව පුහුණුවීම (ආ) තරඟ පිටියෙන් පිටත ස්ථානයක පුහුණුවීම් (ඇ) කමිටුව අනුමත කරන පරිදි කල යුතු වේ.

නීතිය 7-2 උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් දඬුවම් වල අහිමි වීම හෝ ස්ට්‍රෝක් දෙකක් හෝල් දෙකක් අතර උල්ලංඝනය විටකදී ඊලඟ තරඟ හෝල්ට දඬුවම අදාල වේ.

සටහන 1 - නීති උල්ලංඝනය නොවන අයුරින් පුහුණු පහර පුහුණු වීම කල හැකිය.

සටහන 2 - අන්තිමට ක්‍රීඩා කල වල අසල මෘදු තණ පියස මත හෝ අසල පුහුණු වීම නතර කිරීමට කමිටුව වෙත බලය හිමි වේ.

## නීතිය 8 - උපදෙස් : ක්‍රීඩාවේ මාර්ගය (ලයින් ඔෆ් ප්ලේ )

අර්ථය -

උපදෙස් - ක්‍රීඩකයෙකු තමාගේ තරඟ රටාව , පිති තෝරා ගැනීම හෝ පහර එල්ල කිරීම සම්බන්ධයෙන් ලැබෙන යෝජනා හා උපදෙස්ය.

නීතිරීති ගැන තොරතුරු , පොදු තොරතුරු , තරඟ මායිම හෝ මෘදු තණ පියස හි ඇති කොඩි මෙම උපදෙස් ගණයට ඇතුලත් නොවේ.

ක්‍රීඩාවේ මාර්ගය යනු ක්‍රීඩකයෙකු පහර දීමෙන් පන්දුව යැවීමට බලාපොරොත්තු වන දිසාව සහ ඒ දෙපස ඇති සාධාරණ දුරකි. මෙම මාර්ගය පිටිය තුල ඉහළට සෘජුව දිස්වේ නමුත් එය වල එක ඉක්මවා නොයයි.

## * 8 - 1 උපදෙස්

තරඟ වටයක් තුලදී, තමාගේ සහය ක්‍රීඩකයාට හැර වෙනත් අයට උපදෙස් දීම ක්‍රීඩකයෙකු හට කල නොහැකිය. ක්‍රීඩකයාට තමාගේ සහය ක්‍රීඩකයා හෝ ක්‍රීඩා සහයකරු වෙතින් උපදෙස් ලබා ගත හැකිය.

## * 8 - 2 ක්‍රීඩාවේ මාර්ගය පෙන්නුම් කිරීම.

(අ) පටින් ග්‍රීන් බැහැරව

පටින් ග්‍රීන් මතදී හැර ක්‍රීඩකයාට මාර්ගය ගැන උපදෙස් ලැබිය හැකිය. ස්ට්‍රෝක් එල්ල කරන විට කිසිවකු මාර්ගයට සම්බන්ධව ස්ථාන ගත කිරීම කල නොහැකිය. කිසියම් සළකුණක් ක්‍රීඩකයා විසින් යොදා තිබේ නම් ස්ට්‍රෝක් එල්ල කිරීමට පෙර එය ඉවත් කෙරේ.

වෙනත් - කොඩිය සම්බන්ධයෙන් (නීතිය 17-1 බලන්න. )

(ආ) පටින් ග්‍රීන් මත

පන්දුව මෘදු තණ පියස මත තිබියදී ක්‍රීඩකයා හෝ ඔහුගේ සහය ක්‍රීඩකයා හෝ ඔවුන්ගේ කැඩී කරුවන් විසින් පහරක් එල්ල කිරීමට පෙර හෝ එල්ල කරන විට හැර මෘදු තණ පියස ස්පර්ශ නොවන පරිදි පෙන්වාදිය හැකිය. පන්දුව වල තුලට දමන මාර්ගය පෙන්වන කිසිඳු සළකුණක් තැබිය නොහැකිය.

මෙම නීතිය උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් දඬුවම් වල අහිමි වීම හෝ පහරදීමේ තරඟ ස්ට්‍රෝක් දෙකකි.

සටහන - කණ්ඩායම් තරඟයකදී (නීතිය 33-1) කමිටුව විසින් අදාල නීතිරීති වලට අනුව උපදෙස් දීම වෙනුවෙන් එක් පුද්ගලයෙකුට අවස්ථාව ලබා දෙනු ඇත. මෙම පුද්ගලයා පත් කිරීම ගැන උපදෙස් කමිටුව විසින් ලබා දෙන අතර එම පුද්ගලයා කවුදැයි කමිටුවට හඳුන්වා දීමක් කල යුතුය.

# නීතිය 9 - යොදාගත් (ස්ට්‍රෝක් ) පහරවල් සම්බන්ධව තොරතුරු

## * 9 -1 පොදු

ක්‍රීඩකයින් යොදා ගත් පහරවල් ගානට දඬුවම් පහරවල්ද ඇතුලත්ය.

## * 9 - 2 Match play

ක්‍රීඩකයෙකු තමාට ලැබූ දඬුවම පහරක් ගැන ප්‍රතිවාදී ක්‍රීඩකයාට දැනුම් දීමක් කල යුතුය. එවැනි දිනුම් දීමක් නොකලහොත් එය වැරදි තොරතුරු ලබා දීමක් ලෙස සැලකේ.

ප්‍රතිවාදී ක්‍රීඩකයා විසින් අනිත් ක්‍රීඩකයා වෙතින් , හෝල් ඇතුලත ඔහු ක්‍රීඩා කොට තිබෙන පහර ප්‍රමාණය සහ වල සම්පූර්ණ කල පසු ක්‍රීඩා කොට තිබෙන පහරවල් ප්‍රමාණය ගැන විමසීමට අයිතිය ලැබේ.

යම් විධියකින් පහරවල් ප්‍රමාණය ගැන නිවැරදි තොරතුරු ලබා නොදී තිබේ නම් ,ප්‍රතිවාදී ක්‍රීඩකයා මිලඟ පහර එල්ල කිරීමට පෙර එය නිවැරදි නොකලහොත් එම හෝල් එක අහිමි වේ.

කිසියම් ක්‍රීඩකයෙකු හෝල් වෙනුවෙන් ක්‍රීඩා කල පහරවල් ගණන නිවැරදිව ලබාදී නැතිනම් මිලඟ ක්‍රීඩකයා හෝ ක්‍රීඩකයින් ටීන් ග්‍රවුන්ඩ් වලින් තරඟය ආරම්භ කිරීමට පෙර එය නිවැරදි කලොත් දඬුවමක් නොලැබේ. අවසාන ක්‍රීඩාවල ක්‍රීඩා කරනවානම් ක්‍රීඩකයින් ආරම්භක ස්ථානයේ ඉවත් වීමට පෙර දැනුම් දිය යුතුයි. එසේ කිරීමට අපොහොසත් වුණොත් ගොල්ෆ් හෝල් අහිමි වේ

කිසියම් ක්‍රීඩකයෙකු වල වෙනුවෙන් ක්‍රීඩා කල පහරවල් ගණන නිවැරදිව ලබා දී නැත්නම් මිලඟ ක්‍රීඩකයා හෝ ක්‍රීඩකයින් ටින් ග්‍රවුන්ඩ් වලින් තරඟය ආරම්භ කිරීමට පෙර එය නිවැරදි කලොත් දඬුවමක් නොලැබේ.අවසාන ගොල්ෆ් හෝල් ක්‍රීඩා කරනවානම් ක්‍රීඩකයින් ආරම්භක ස්ථානය ඉවත් වීමට පෙර දැනුම් දිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වුණොත් ක්‍රීඩා වල අහිමි වේ.

✻ 9 - 3 පහර එල්ල කිරීම.

ක්‍රීඩකයෙකුට දඬුවම ලැබී ඇත්නම් ඔහු විසින් වහාම ඒ බව ලකුණුකරුට දැන්විය යුතුය.

## නීතිය 10 - තරඟ පිළිවෙල

අර්ථය - ආරම්භක ස්ථාන වලින් මුලින්ම ක්‍රීඩා කරන අවස්ථාව ලැබෙන ක්‍රීඩකයාට ගෞරවය (හොනර්) හිමි වුවේ යැයි කියනු ලැබේ.

✻ 10 - 1 තරඟය (මැච් ප්ලේ )

(අ) ආරම්භක ස්ථානය

තරඟ පිළිවෙල අනුව පිළකට ආරම්භක ස්ථානය සිට ක්‍රීඩා කිරීමට අවස්ථාව ලැබේ. විශේෂ පිළිවෙලක් නැතිනම් කුසපත් ඇදීමෙන් පළමුවැනි ගෞරවය හිමි වේ. හෝල් ජයග්‍රහණය කරන පිළට ඊළඟ ආරම්භක ස්ථානය වලදී පළමුවැනි වරට හිමි වේ. දෙපිළම සම වුණොත් කලින් තරඟය ආරම්භ කල පිළට නැවත මුල්ම අවස්ථාව ලැබෙනු ඇත.

(ආ) ආරම්භක ස්ථානය පිටත.

පන්දු වලින් ක්‍රීඩා කරන විට වල වලින් වඩා දුර වූ පන්දුවට මුල්ම ක්‍රීඩා කිරීමට අවස්ථාව ලැබේ. පන්දු වල දුර ප්‍රමාණය (හෝලය වෙත ඇති.) සහ වී තිබේ නම් කුසපත් ඇදීමෙන් ක්‍රීඩා කිරීමට තෝරා ගැනේ. (නීතිය 30-3 ඇ බලන්න)

(ඇ) අවස්ථාවට කලින් ක්‍රීඩා කිරීම.

කිසියම් ක්‍රීඩකයෙකු තමාගේ වාරයට කලින් ක්‍රීඩා කල හොත් , ප්‍රතිවාදී ක්‍රීඩකයා විසින් එම පහර අවලංගු කරන ලෙස ඉල්ලීමක් කල යුතුය. දඬුවම තොරව නිසි ස්ථානයේ සිට නියමිත තරඟයට පහර එල්ල කිරීමට අවස්ථාව ලැබේ. (නීතිය 20-5)

✻ 10 - 2 පහර

(අ) ආරම්භක ස්ථානය

තරඟ පිළිවෙලට හෝ කුසපත් ඇදීමකින් ක්‍රීඩා කිරීමට පළමුවැනි වාරය හිමි වේ. වල වෙනුවෙන් අඩුම ලකුණු ලබාගත් ක්‍රීඩකයාට තරඟය ආරම්භ කිරීමට මිලඟ අවස්ථාව ලැබේ. ලකුණු ලබාගත් පිළිවෙල අනුව ක්‍රීඩා කිරීමට අවස්ථාව ලැබේ. ක්‍රීඩකයින් කිහිප දෙනෙකු සම ලකුණු ලබාගෙන තිබේ නම් කලින් වාරයේදී ක්‍රීඩා කල පිළිවෙලට ක්‍රීඩා කිරීම සිදු වේ.

(ආ) ආරම්භක ස්ථානයෙන් පිටත.

පන්දු ක්‍රීඩා කරන විට ක්‍රීඩා වල දුරින් වූ පන්දුව පළමුව ක්‍රීඩා කල යුතුය. පන්දු කීපයක් සමාන බව පෙන්නුම් කරන විට කුසපත් ඇදීමක් මගින් ක්‍රීඩා කිරීමට වාරය තෝරා ගැනේ

වෙනත් - (නීතිය 22)සහ (නීතිය 31-5) බලන්න.

(ඇ) අවස්ථාවට කලින් ක්‍රීඩා කිරීම.

වාරයට කලින් පන්දුව පතිත වූ ස්ථානයේ සිට ක්‍රීඩකයෙකු ක්‍රීඩා කල හොත් දඬුවම බලපවත්වන්නේ නැත. මෙහි රෙකුලාසි 2(අ) ,2(ආ) සහ 3ට අදාල නොවන පරිදි, ක්‍රීඩකයින් තමන් යොදා ගත් පිළිවෙලට ක්‍රීඩා කරන බව කමිටුවට හැඟී ගියහොත් තරඟයෙන් අවලංගු කිරීමක් සිදු වේ.
( තවත් තොරතුරු වෙනුවෙන් (නීතිය 16-1ඊ )සහ (නීතිය 29-3 )බලන්න.

✻ 10 - 3 අතිරේක පන්දුව හෝ දෙවෙනි පන්දුව ආරම්භක ස්ථානය

ක්‍රීඩකයෙකු අතිරේක පන්දුවක් හෝ දෙවැනි පන්දුවක් ක්‍රීඩා කල යුත්තේ ප්‍රතිවාදී ක්‍රීඩකයා හෝ සහය ක්‍රීඩකයා පළමුවැනි පහර ක්‍රීඩා කලාට පසුවය. යම් විධියකින් ක්‍රීඩකයෙකු තමාගේ වාරයට කලින් අතිරේක හෝ දෙවෙනි පන්දුව ක්‍රීඩා කලහොත් මෙහි 1(ඇ) සහ 2(ඇ) රෙකුලාසි බල පවත්වයි.

✻ 10 - 4 පන්දුව ඉවත් කිරීම.

දුරින් වූ පන්දුව ගණනය කිරීම සඳහා පන්දුවක් ඉවත් කලහොත් දඬුවම නොලැබෙන අතර පන්දුව නැවත තිබූ ස්ථානයටම තැන්පත් කල යුතුය.

## නීතිය 11 - ටීන් ග්‍රවුන්ඩ්

අර්ථය - ක්‍රීඩා වල ක්‍රීඩා කිරීම වෙනුවෙන් තරඟය ආරම්භක ස්ථානය ආරම්භක ස්ථානය වේ. මෙය සමචතුරස්‍රාකාර ක්ලබ් දෙකක පමණ ගැඹුරක් සහිත ස්ථානයකි. මෙය පැහැදිලිව දෙපසින් සටහන් කොට තිබේ. පන්දුවක් මෙම ස්ථානයෙන් පිටතට යාමක් ඉවතට යාමක් ලෙස සැලකේ.

✻ 11 -1 ටීන් (මුල්ම ස්ථානය)

පිටියෙන් තරමක් ඉහළට එසවෙන සේ පස් හෝ වැලි වෙනත් දෙයක් යොදා ගෙන පන්දුව එහි තබා ක්‍රීඩකයා පන්දුවට පහර දීම සඳහා ක්‍රීඩකයා ඉන් පිටතද සිටිය හැකිය.

✻ 11 - 2 ටී මාර්කස්

ක්‍රීඩකයෙකු ආරම්භක ස්ථානය සිට පළමුවැනි පහර එල්ල කිරීමට පෙර නියමිත පහර සළකුණු නිසි පරිදි තැබිය යුතුය. යම් විධියකින් ක්‍රීඩකයෙකු තමාගේ තරඟ ඉරියව්ව වෙනුවෙන් පහර සළකුණු වෙනස් කරනවානම් ඔහු නීතිය 13-2 උල්ලංඝනය කිරීමක් සිදු කරයි.

✻ 11 - 3 පන්දුව ටී වෙතින් වැටීම.

ක්‍රීඩාවට පෙර පන්දුව මෙලෙස බිම පතිත වේ නම් දඬුවම නොරව පන්දුව ටී මත නැවත තැබිය හැක. මෙවැනි තත්වයක් හමුවේ පන්දුවට ස්ට්‍රෝක් එල්ල කල විටදී එය ගණන් ගැනීමක් සිදු වේ.

✻ 11 - 4 ආරම්භක ස්ථානය පිටත ක්‍රීඩා කිරීම.

(අ) ක්‍රීඩා කිරීම. (පිටුදැකීමේ තරඟ)

ක්‍රීඩකයෙකු හෝල් ආරම්භ කරන විට පිටත සිට ක්‍රීඩා කලහොත් , ප්‍රතිවාදී ක්‍රීඩකයා විසින් එම ස්ට්‍රෝක් අවලංගු කරන ලෙස ඉල්ලීමක් කල හැකිය. මෙහිදී දඬුවම නොරව මෙහිදී ආරම්භක ස්ථානය සිට නැවත ක්‍රීඩා කිරීමට අවස්ථාව ලැබේ.

(ආ) පහරදීමේ ලකුණු ගැනීම

හෝල් ආරම්භ කරන විට ක්‍රීඩකයෙකු පිටත සිට එය කලහොත් පහර දෙකක් ඇතුලත් පෙනල්ටි ලැබේ. නැවත ඇතුලත සිට ක්‍රීඩා කල යුතුය. යම් විධියකින් සිදු වූ වරද නිවැරදි නොකර ගෙන මීලඟ ආරම්භක ස්ථානය සිට ක්‍රීඩා කලහොත් ක්‍රීඩකයෙකු තරඟයෙන් අවලංගු වීමක් සිදු වේ. ලකුණු සටහන් නොවේ.

* 11 - 5 වැරදි ආරම්භක ස්ථානය ක්‍රීඩා කිරීම.

මෙහි (නීතිය 11-4 ) රෙකුලාසි බලපවත්වනු ලැබේ.

## නීතිය 12 - පන්දුව ක්‍රීඩා කිරීම , හඳුනා ගැනීම. සහ සොයා ගැනීම.

අර්ථයන් - බාධකයක් යනු වැලි සහිත ආරක්ෂක ස්ථාන හෝ වතුර මායිම් ය.

බන්කර් යනු තරඟ පිටියට සම්බන්ධ තණකොළ සහ පස් ඉවත් කොට වැලි යොදා සකස් කල ස්ථානයකි. හැසඩ් එකක් වටේ ඇති හෝ ඇතුලත ඇති තණකොළ සහිත කොටසක් ඇතුලත් නොවේ. මෙහි සීමාව සෘජුව පහළට විහිදෙයි. (උඩට නොවේ. ) පන්දුවක් වැලි සහිත ආරක්ෂක ස්ථාන තුලට ඇතුලූ වූ පසු එය එහි පතිත වූවක් ලෙස සැලකේ.

වතුර මායිම යනු මුහුද , විල , පොකුණ , ගඟ හෝ වෙනත් ජල කොටසක් සම්බන්ධ වන ස්ථානයකි. මෙහි භූමිය තුල රඳාපවතින ජලය ඊට ඇතුලත්ය . මෙහි සීමාවන් පැහැදිලිව සළකුණු කොට ඇත. පන්දුවක් වතුර මායිම තුලට පතිත වූ විට එය එහි ඇතුලත් දෙයක් ලෙස සැලකේ.

සටහන 1 - වතුර මායිම (වෙනත් දෙයක් නොවන ) කහ පැහැති ඉරි හෝ ටිට් වලින් සළකුණු කොට තිබේ.

සටහන 2 - වතුර මායිම සම්බන්ධ පළාත් නීති පිළිබඳව නිගමනය කිරීම කමිටුව මගින් කරනු ලැබේ.

* 12 - 1 පන්දුව සෙවීම සහ දැකීම.

තරඟ පිටිය තුල පන්දුව සෙවීමේදී ක්‍රීඩකයා විසින් පිටියට හානියක් නොවන පරිදි එය කල යුතුය. පහරක් එල්ල කල පසු ක්‍රීඩකයාට පන්දුව දැකීමට ස්ථිරව උවමනා නැත.

මායිම තුලට පන්දුව ගිය විටදී එය දකින ආකාරයට ක්‍රීඩකයා විසින් පහසු ක්‍රමයට එය ලබා ගත යුතුය. වැලි ආදී බාධකයන් තුලින් පන්දුව ඉවත් කිරීමට අදාල උපකරණයක් භාවිතා කල යුතුය. (නීතිය 23 බලන්න. ) සුදුසු නොවන පිටියක් මත පන්දුව පතිත වීමකදී පන්දුව නැවත ලබා ගෙන අදාල ස්ථානය මත තැන්පත් කිරීම ගැන (නීතිය 25-1 (ආ) ) අදාලව කටයුතු කල යුතුය.

වතුර මායිම මත පන්දුව පතිත වුණොත් ක්‍රීඩකයාට පිත්තක් හෝ සුදුසු වෙනත් දෙයක් එය ඉවතට ගැනීම සඳහා යොදා ගත හැකිය. මෙහිදී (නීතිය 26-1) යටතේ තවදුරටත් ක්‍රීඩා කිරීමට ඉඩ කඩ ලැබේ.

නීතිය 12-1 උල්ලංඝනය කිරීම වෙනුවෙන් දඬුවම ක්‍රීඩාවල හෝ පහරදෙකක් අහිමි වීම.

* 12 - 2 පන්දුව හඳුනා ගැනීම .

නිසි පන්දුව යොදාගෙන තරඟ කිරීම ක්‍රීඩකයෙකු සතු වගකීමකි. තමාගේ පන්දුවට සළකුණක් යොදා ගත යුතුය.

බාධකයකදී හැර පන්දුව ඉවතට ගෙන පිරිසිදු කිරීමට අවස්ථාව ක්‍රීඩකයාට ලැබේ. මෙලෙස පන්දුව ඉවත් කිරීම ගැන ප්‍රතිවාදී ක්‍රීඩකයාට සහය ක්‍රීඩකයාට හෝ සටහන් කරුට දැනුම් දීමක් කල යුතුය. නැවත නිසි පිරිදි පන්දුව ක්‍රීඩාවට තැන්පත් කල යුතුය. යම් විධියකින් මෙම ක්‍රීඩා පිළිවෙල අනුගමනය නොකලහොත් දඬුවම් ලෙස එක පහර අහිමි වේ. පන්දුවක් යොදා ගැනීමේ පිළිවෙල අනුගමනය නොකරන විටදී (නීතිය 20-3 (අ) ) උල්ලංඝනය කිරීම වෙනුවෙන් දඬුවම් ලැබේ. නමුත් නීතිය 12-2 යටතේ අතිරේක දඬුවමක් ලැබෙන්නේ නැත.

## නීතිය - 13 පන්දුව පතිතව තිබියදී ක්‍රීඩා කිරීම.

අර්ථයන්

වැලි සහිත ආරක්ෂක ස්ථානය යනු පිටියේ විශේෂයෙන් සකස් කල ස්ථානයකි. ජල බාධකයක් යනු තරඟ පිටිය තුල තිබෙන ජලය සහිත කොටසකි.

ක්‍රීඩාවේ මාර්ගය යනු ක්‍රීඩකයෙකු පහරක් එල්ල කිරීමෙන් පසු ඔහු බලාපොරොත්තු වන පන්දුව ගමන් කරන ඉසව්වයි. මෙම මාර්ගය සෘජුව පිටියේ ඉහළට ගමන් කරයි. නමුත් එය ක්‍රීඩා වල ඉක්මවා නොයයි. ස්ට්‍රෝක් එල්ල කිරීම වෙනුවෙන් ක්‍රීඩකයා ස්ථානගත වීමේ ඉරියව්වද වැදගත්ය.

* 13 - 1 පොදු

පන්දුව පතිතව තිබියදී ක්‍රීඩා කල යුතුය. එසේ නැතිනම් නීතිරීති වලට අදාලව ක්‍රීඩා කල යුතුය.

* 13 - 2 ආරම්භක ඉරියව්ව , පහර දීම , ක්‍රීඩා මාර්ගය සහ පන්දුව පතිතව තිබීම.

නීතිරීති වලට අදාල නොවන සේ ක්‍රීඩකයෙකු විසින් පහත අයුරින් වර්ධනයක් නොකල යුතුය.
තමාගේ ස්ථානය හා පන්දුව පතිතව තිබීම.
ආරම්භක ඉරියව්ව සහ පහර දීම සඳහා ප්‍රදේශය
ක්‍රීඩා වල ඉක්මවා ක්‍රීඩාවේ මාර්ගය
තමා විසින් පන්දුව පතිත කරනු ලබන ස්ථානය පහත සඳහන් ක්‍රමයන් මත.
එහා මෙහා යාම , පිටිය තුල තිබෙන ස්ථිර දෙයක් නැමීම හෝ කැඩීම , වැඩෙන දෙයකට හානි කිරීම
ක්‍රීඩාංගනය භූමියට හානියක් නොකිරීම.
පිටිය මත තිබෙන වැලි සහ සැහැල්ලු පස ඉවත් කිරීම , ජලය , පිනි , හිම , ආදිය ඉවත් කිරීම.

පහත සඳහන් දේවල් හැර .

මූලික ඉරියව්ව ගන්නා විටදී (ඉරියවුව )
පහරක් එල්ල කරන විට හෝ ක්ලබ් පසුපසට (ඉරියව්ව ) ගැනීම.
ආරම්භක ස්ථානයේදී භූමිය මත සුදුසු නැති දේවල් ඉවත් කිරීම හෝ ඇති කිරීම.
මෑදු තණ පියස මත පවතින වැලි හෝ බුරුල් පසක් ඉවත් කිරීමකදී.
භූමිය මත පිත්ත සැහැල්ලුව තබන විටදී

වෙනත් - පන්දුව මායිම තුල (නීතිය 13-4 ) බලන්න.

* 13 - 3 මූලික ඉරියව්ව

මූලික ඉරියව්ව සඳහා පාද නිසියාකාරව තැබීම ක්‍රීඩකයාට කල හැකිය.

* 13 - 4 පන්දුව බාධකයක් තුල (ඉරියවුව )

නීතිරීති වලට අනුව හැර බාධකයක් තුල පවතින පන්දුවට (වැලි සහිත බේගලයක් හෝ ජල බාධකයක් ) පහරක් එල්ල කිරීමට පෙර , ඉවතට ගැනීමට පෙර හෝ පතිත කිරීමට පෙර ක්‍රීඩකයා විසින් නොකල යුතු :

(අ) බාධකයක් හෝ ඊට සමාන බාධකයක තත්වය පරීක්ෂා කිරීම.
(ආ) පිත්තෙන් හෝ වෙනත් දෙයකින් බාධකය තුල භූමිය හෝ ජල බාධකයක ජලය ස්පර්ශ කිරීම.
(ඇ) බාධකයක් තුල තිබෙන බුරුල්වූ දෙයක් ස්පර්ශ කිරීම හෝ ඉවත් කිරීම.

වෙනත්

1) ඔනෑම මායිම තුල ඇද වැටිමක් වෙනුවෙන් දඬුවම් නොලැබේ. එසේම පිනි හැන්පත් කිරීමකටද දඬුවම් නොලැබේ.

2) ක්‍රීඩකයා විසින් පහර එල්ල කල පසු ඔහුගේ ක්‍රීඩා සහයකරු අවසරයකින් තොරව බාධකය තුල පස සැහැල්ලු කිරීම නොකල යුතුය.

සටහන - තරඟ පිටිය තුල තණකොළ , පඳුරක් , ගසක් හෝ වැවෙන වෙනත් දෙයක් මත පිත්ත තැබීම කල හැක්කේ තරඟ කමිටුවේ අවසරය මතය.

නීතිය උල්ලංඝනය කිරීම වෙනුවෙන් දඬුවම - වල අහිමි වීම හා පහර් දෙකක් අහිමි වීම.

## නීතිය 14 - ස්ට්‍රෝක් එල්ල කිරීම.

අර්ථය - පන්දුව ඉදිරියට යාම සඳහා පිත්තෙන් පහර එල්ල කිරීමයි. පිත්තේ පහර කොටසේ වැදී පන්දුව ඉදිරියට යා යුතුය.

✻ 14 - 1 පන්දුව පහර දීම

පිත්තේ හිස සහිත කොටසින් පහර දීම මිස පන්දුව තල්ලු කිරීම නොවේ.

✻ 14 - 2 සහය

පහරක් එල්ල කිරීමේදී ක්‍රීඩකයා නොකලයුතු :

(අ) ශාරීරික සහය හෝ ආරක්ෂාව ලබා ගැනීම.

(ආ) පන්දුවේ ගමන් මාර්ගයට සහය වන පරිදි ක්‍රීඩා සහයකරු , සහය ක්‍රීඩකයා හෝ සහය ක්‍රීඩකයාගේ සහයකරු ස්ථානගත කිරීම.

නීතිය 14-1 හෝ 2 උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් දඬුවම් වල හෝ ස්ට්‍රෝක් දෙකක් අහිමි වීම.

✻ 14 - 3 නුසුදුසු හා කෘත්‍රිම උපකරණ

14 - 3 නීතිය යටතේ උල්ලංඝනය වන පරිදි ක්‍රීඩකයෙකු කිසියම් උපකරණයක් යොදා ගන්නවා නම් සාන්ත ඇන්ඩෲස්හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජය වෙතින් ඒ ගැන උපදෙස් ලබා ගත යුතුය.

ක්‍රීඩාව වෙනුවෙන් නිපදවන අලුත් උපකරණයක් ගැන තොරතුරු නිෂ්පාදක වරයා විසින් සාන්ත ඇන්ඩෲස්හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජය වෙත අවසරයක් සඳහා ලබා දිය යුතුය. එවැනි උපකරණ සාම්පලයක් සමීක්ෂණය සඳහා සාන්ත ඇන්ඩෲස්හි රාජකීය සහ පැරණි ගොල්ෆ් සමාජයේ නිත්‍ය වස්තුවක් බවට පත්වේ. යම් විධියකින් අවසරයක් නොලබා නිෂ්පාදනය කිරීම හෝ අලෙවි කිරීම නීතිරීති වලට පටහැනිය.

නීතිරීති වලින් පිටත තරඟ වටයකදී ක්‍රීඩකයා විසින් නුසුදුසු හෝ කෘත්‍රිම උපකරණයක් භාවිතා නොකල යුතු :

(අ) තමාගේ පහර එල්ල කිරීමට උපකාරී වන

(ආ) තමාගේ ක්‍රීඩාවට අදාල දුර මැනීමට උපකාරී වන

(ඇ) ක්ලබ් දැතට අල්වා ගැනීමට උපකාරී වන පහත සඳහන් දේවල් හැර

(1) භාවිතයට ගන්නා සාමාන්‍ය අත්වැසුම්

(11) වේලීමට ගන්නා පවුඩර් වැනි දේවල්

(111) ලේන්සුවක් හෝ තුවායක් වැනි දෙයක් .

නීතිය 14-3 උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් දඬුවම - තරඟයෙන් අවලංගු කිරීම.

* 14 - 4 එක වතාවකට වඩා පන්දුවට පහර දීම.

පහරක් එල්ල කිරීමේදී එක පහරකට වඩා අතිරේක පහරවල් පන්දුවේ වැදුනහොත් එම පහරත් , තව අතිරේක දඬුවම් පහරක්ද සමග පහරවල් දෙකක් එකතු වේ.

* 14 - 5 ගමන් ගන්නා පන්දුව ක්‍රීඩා කිරීම.

පහත සඳහන් ආකාරයට හැරුන විට ක්‍රීඩකයෙකු විසින් ගමන් ගන්නා පන්දුවට පහර එල්ල නොකල යුතුය.

ආරම්භයේදී පන්දුව ටී මගින් පතිත වීම. නීතිය 11-3 .
එක වතාවකට වඩා පන්දුවට පහර දීම. නීතිය 14-4
පන්දුව ජලය මත යාම. නීතිය 14-6
පන්දුව ගමන් කිරීම ආරම්භ වන්නේ ක්‍රීඩකයෙකු පහර එල්ල කල විටදීය. පහත සඳහන් නීතිරීති යටතේ ලැබෙන දඬුවම ක්‍රීඩකයා විසින් පිළිගත යුතුය.
පන්දුව පතිතව තිබියදී එහා මෙහා කිරීම. නීතිය 18-2 (අ)
පහරකට පසුව පන්දුව එහා මෙහා කිරීම. නීතිය 18-2 (ආ)
බුරුල් දෙයක් මත පන්දුව පතිත වීම. නීතිය 18-2 (ඇ)
(හිතාමතා පන්දුවක් නතර කිරීම. - ක්‍රීඩකයෙකු , සහය ක්‍රීඩකයෙකු හෝක්‍රීඩා සහයකරු විසින් (නීතිය1-2 )

* 14 - 6 ජලය මත පන්දුව

වතුරමායිම තුල පන්දුව තිබියදී දඬුවමකින් තොරව ක්‍රීඩකයාට පහරක් එල්ල කල හැකිය. සුළඟ හෝ රැල්ල මගින් පන්දුවේ ඉරියව්වට බාධාවක් සිදු වන්නට කලින් ක්‍රීඩකයා මෙම පහර එල්ල කල යුතුය. නීතිය 26 අදාලව පන්දුව ඉවත් කිරීමක් සිදු කිරීමට පුළුවන.

නීතිය 14-5 හෝ 6 උල්ලංඝනය කිරීම වෙනුවෙන් දඬුවම - වල අහිමි වීම - පහර දෙකක්.

## නීතිය 15 - වැරදි පන්දුව , අතිරේක පන්දුව

අර්ථය - වැරදි පන්දුව යනු ක්‍රීඩකයාට අයත් පහත සඳහන් පන්දු හැර වෙන ඕනෑම පන්දුවකි.

(අ) ක්‍රීඩාවේ පවතින පන්දුව
(ආ) වෙනත් පන්දුවක් හෝ
(ඇ) නීතිය 3-3 හෝ නීතිය 20-7 (ආ) යටතේ යොදා ගන්නා දෙවැනි පන්දුවක්.

* 15 - 1 පොදු

ආරම්භක ස්ථානයේ සිට යොදා ගන්නා පන්දුව ක්‍රීඩකයා විසින් ක්‍රීඩා කල යුතුය. අතිරේක පන්දුවක් යොදා ගැනීමට ලැබෙන්නේ නීතිය යටතේ ලැබෙන ඉඩකඩ අනුවය. ඉඩකඩ නොලැබුන විටකදී අතිරේක පන්දුවක් යොදා ගතහොත් එය වැරදි පන්දුවක් නොව ක්‍රීඩාවේ යෙදෙන පන්දුවකි. නීතිය 20-6 යටතේ වරද නිවැරදි නොකලහොත් එක් වල හෝ පහර දෙකක් අහිමි වීම සිදු වේ.

* 15 - 2 ක්‍රීඩාවේ යෙදීම.

මායිම් එකකදී, හැර ක්‍රීඩකයෙකු විසින් වැරදි පන්දුවකට පහරක් එල්ල කලහොත් ගොල්ෆ් හෝල් අහිමි වේ.

මායිම තුලදී වැරදි පන්දුවකට පහරක් එල්ල කලහොත් දඬුවමක් නොලැබෙන අතර ක්‍රීඩකයාට ලකුණු එකතු වීමක්ද සිදු නොවේ.වැරදි පන්දුව වෙනත් ක්‍රීඩකයෙකුට අයිති එකක් නම් , එම පන්දුව අයිති ක්‍රීඩකයා නියම තැන සිට නැවත තරඟය ආරම්භ කල යුතුය. ක්‍රීඩකයා සහ ප්‍රතිවාදී ක්‍රීඩකයා පන්දු මාරු කරගෙන ක්‍රීඩා කලහොත් මුලින්ම ක්‍රීඩා කල ක්‍රීඩකයාට වල අහිමි වේ.

✻ 15 - 3 පහර එල්ල කිරීම. (පහර)

ක්‍රීඩකයෙකු වැරදි පන්දුවකින් පහරක් එල්ල කළහොත් පහරවල් දෙකක දඬුවමක් ලැබේ. නමුත් බාධකයක් තුල එල්ල කරන මෙවැනි පහරකට දඬුවමක් නොලැබේ.

ක්‍රීඩකයා තමාගේ වරද නිවැරදි කර ගැනීමට නිවැරදි පන්දුවට පහර දිය යුතුය. මීලග ආරම්භක ස්ථානය පහරක් එල්ල කිරීමට පෙර හෝ අවසාන හෝල් ක්‍රීඩා කිරීමට පෙර හෝ තමාගේ වරද නිවැරදි කර ගැනීමට ක්‍රීඩකයා කටයුතු නොකලහොත් ඔහුව තරඟයෙන් අවලංගු වීමට ඉඩ තිබේ.

වැරදි පන්දුවකින් එල්ල කරන පහරවල් වලට ලකුණු එකතු නොවේ.

වැරදි පන්දුව වෙනත් ක්‍රීඩකයෙකුට අයිති නම් ඔහු නියමිත ස්ථානයේ සිට නැවත ක්‍රීඩාව ආරම්භ කල යුතුය.

## නීතිය 16 - සුමුදු තණතිල්ල (පටින් ග්‍රීන් )

අර්ථය - ක්‍රීඩා වල මෘදු තණපියස ඇතුලත්ය. පිත්තෙන් පන්දුව තල්ලු කිරීම සඳහා මෙම කොටස භාවිතා කෙරේ.

මෘදු තණපියස මතදී පන්දුවේ මාර්ගය ක්‍රීඩකයා පහරක් එල්ල කල විට බලාපොරොත්තු වන මාර්ගයයි. ක්‍රීඩා වල තුලට පන්දුව ගිය විටදී එය සම්පූර්ණ වල ගත වීමකි.

✻ 16 - 1 පොදු

(අ) පන්දුව තල්ලු කල පසු එහි ගමන් මාර්ගය ඇල්ලීම.

පන්දුව ඇල්ලීමට පහත සඳහන් දේවල් හැර නොකල යුතුය.

(1) මෘදු තණපියස මත තිබෙන වැලි හෝ බුරුල් පස ඉවත් කිරීම පැත්තකට දැමීම ක්‍රීඩකයා විසින් කරන විටදී (අතින් හෝ පිත්තෙන් ) හානියක් නොකිරීම.

(11) පන්දුව අභියස ක්ලබ් තැබීමේදී හානිදායක දෙයක් නොකිරීම.

(111) මැනීම සඳහා - නීතිය 10-4

(1V) පන්දුව එසවීම සඳහා - නීතිය 16-1 (ආ)

(V) පන්දු ආධාරකයක් තදබල ලෙස භාවිතය.

(V1) මෘදු තණපියස මත පන්දු ආධාරක හෝ බිලට අනුබද්ධ දෙයක් අලුත් වැඩියා කිරීම.

(V11) ගමන් ගන්නා බාධකයක් ඉවත් කිරීම. නීතිය 24-1

(ආ) පන්දුව එසවීම.

මෘදු තණපියස මතින් පන්දුව එසවීම හා කැමති නම් පිරිසිදු කිරීම කල හැකිය. එය ඉවත් කල ස්ථානයේම නැවත තැබිය යුතුය.

(ඇ) පන්දු ආධාරක , වල ආධාරක සහ වෙනත් දෙයක් අලුත් වැඩියාව.

පන්දුවකින් වන හානියක් අලුත්වැඩියා කිරීමට ඉඩකඩ ලැබේ. මෙවැනි අවස්ථාවක ඉවත් කෙරෙන පන්දුව හෝ පන්දු ලකුණු කරන්නා නැවත නියමිත ස්ථානය මත තැබිය යුතුය. මේ සඳහා දඬුවමක්
නොලැබේ. ක්‍රීඩකයාගේ ක්‍රීඩාවට අදාල වන පරිදි මෘදු තණපියස මත වෙනත් අලුත්වැඩියා කිරීමක් නොකල යුතුය.

(ඉ) වෙනත් පන්දුවක් ක්‍රීඩාවේ පවතින විට පහරක් එල්ල කිරීම.

මෘදු තණපියස මත පන්දුවක් ක්‍රීඩාවේ යෙදෙන විට ක්‍රීඩකයෙකු විසින් පහරක් එල්ල කිරීම නොකල යුතුය. තමාගේ වාරයේදී පමණක් ක්‍රීඩා කල යුතුය.

නීතිය 16-1 උල්ලංඝනය කිරීම වෙනුවෙන් පෙනල්ටි හෝල් අහිමි වීම. - ස්ට්‍රෝක් දෙකක් අහිමි වීම.

(සහය ක්‍රීඩකයා හෝ ක්‍රීඩා සහයකරු ස්ථානගත වීම නීතිය 14-2 )

(වැරදි මෘදු තණපියස - නීතිය 25-3 )

* 16 - 2 පන්දුව හෝල් මුදුනත පතිත වීම.

පන්දුව වල මුදුනත පතිතව තිබෙන විටදී ප්‍රමාදයකින් තොරව ක්‍රීඩකයාට වල අසලට යාම සඳහා තත්පර 10ක කාලයක් ලැබේ. එවිට පන්දුව පතිත වීමක් නොවුණොත් එය නතර වීමක් ලෙස සැකේ. පසුව පන්දුව පතිත වීමක් සිදුවුණොත් එය අවසාන පහරෙන් පතිත වීමක් ලෙස සැලකෙන අතර දඬුවම් පහරක් ලකුණු අතරට එකතු වීමක් සිදු වේ. එසේ නැතිනම් නීතිය යටතේ දඬුවම් නොලැබේ. (ප්‍රමාදය වෙනුවෙන් නීතිය 6-7 )

## නීතිය 17 - කොඩිය

අර්ථය - කොඩිය සම්බන්ධ රිට එහා මෙහා ගෙන යන සෘජු එකකි. මෙය ස්ථානය පෙන්නුම් කිරීමට ක්‍රීඩා වල මත මධ්‍යගත කෙරේ.

* 17 - 1 කොඩිය ගෙන යාම , ඉවත් කිරීම හෝ පතිත කිරීම.

පහර එල්ල කිරීමට පෙර හෝ එල්ල කරන විට වල මත ස්ථානය පෙන්නුම් කිරීමට කොඩිය ගෙන යාම, ඉවත් කිරීම හෝ පතිත කිරීම සිදු වේ. මෙය සිදු වන්නේ පහරක් එල්ල කිරීමට පෙර කොඩිය ගෙන යාම , ඉවත් කිරීම හෝ පතිත කිරීම කිසියම් පුද්ගලයෙකු විසින් කරනු ලබන්නේ ක්‍රීඩකයාගේ අනුදැනුම මත නම් විරුද්ධ වීමක් ඇති නොවේ. කිසියම් පුද්ගලයෙකු කොඩිය අතැතිව ක්‍රීඩා වල අසල සිටී නම් එල්ල කරනු ලබන පහර මගින් පන්දුව නතර වන තුරු එය තබා ගත යුතුය.

* 17 - 2 අනුමැතිය නොලද කටයුත්ත

(අ) ක්‍රීඩාවේ යෙදීම.

ක්‍රීඩාව පවතින විට ප්‍රතිවාදී ක්‍රීඩකයා හෝ ඔහුගේ ක්‍රීඩා සහයකරු ක්‍රීඩකයාගේ අනුමැතිය නොමැතිව කොඩිය ගෙන යාම , ඉවත් කිරීම හෝ පතිත කිරීම නොකලයුතුය.

(ආ) පහර එල්ල කිරීම.

යම් විධියකින් ක්‍රීඩකයෙකු ස්ට්‍රෝක් එල්ල කරන විට ප්‍රතිවාදී ක්‍රීඩකයෙකු හෝ ක්‍රීඩා සහයකරු කොඩිය ගෙන යාම , ඉවත් කිරීම හෝ පතිත කිරීම හෝ කලහොත් මෙම නීතිය උල්ලංඝකය කිරීම වෙනුවෙන් දඬුවම් ලැබෙනු ඇත.

මෙවැනි අවස්ථාවක ක්‍රීඩකයාගේ පන්දුව කොඩිය මත පතිත වුණොත් පෙනල්ටි නොලැබෙන අතර පන්දුව පතිත වුණ ස්ථානයේ සිට ක්‍රීඩා කල යුතුය. යම් විධියකින් පහර එල්ල කිරීමට ඉඩකඩ ලැබේ.

නීතිය 17-1 හෝ 2 උල්ලංඝනය කිරීම වෙනුවෙන් වල අහිමි වීම හා පහර දෙකක්.

* 17 - 3 පන්දුව කොඩිය හෝ එය දරන්නා වෙත පතිත වීම.

ක්‍රීඩකයාගේ පන්දුව පතිත නොවීම.

(අ) ක්‍රීඩකයාගේ අනුදැනුම මත ඔහු විසින් සහය ක්‍රීඩකයා විසින් හෝ ක්‍රීඩා සහයකරු හෝ වෙනත් පුද්ගලයෙකු විසින් කොඩිය ලබාගෙන තිබියදී හෝ

(ආ) ක්‍රීඩකයාගේ අනුදැනුම මත ඔහුගේ සහය ක්‍රීඩකයා හෝ සහය ක්‍රීඩකයාගේ ක්‍රීඩා සහයකරු හෝ වෙනත් පුද්ගලයෙකු කොඩිය සම්බන්ධව කටයුතු කරමින් සිටින විටදී හෝ

(ඇ) ක්‍රීඩා වල මත කොඩිය පවතින විට මෘදු තණ පියස මත සිට පන්දුව ක්‍රීඩා කළ විටදී .

නීතිය 17-3 උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් වල අහිමි වීම පහර දෙකක් පන්දුව පතිත වුණ ස්ථානයේ සිට ක්‍රීඩා කල යුතුය.

* 17 - 4 පන්දුව කොඩිය අසල නතර වීම.

කොඩිය ක්‍රීඩා වල තුල තිබෙන විට පන්දුව ඒ අසල නතර වුවහොත් ක්‍රීඩකයා හෝ ඔහු විසින් අනුමැතිය ලැබෙන පුද්ගලයෙකුට කොඩිය ඉවත් කිරීම කල හැකිය. එවිට පන්දුව හෝල් තුලට පතිත වීමක් සිදු වුණොත් ක්‍රීඩකයාගේ අවසාන පහරින් එය සිදු වූ බව ගණන් ගැනේ. එසේ නොවුවහොත් පන්දුව වල අභියස තබා දඬුවම් තොරව ක්‍රියා කල හැකිය.

## නීතිය 18 - පන්දුව ගමන් කිරීම (මුව්ඩ්)

අර්ථය - ස්ථානයකින් පන්දුව තිකුත්ව එය වෙනත් ස්ථානයක නතර වීම තෙක් පන්දුව ගමන් කිරීම සිදු වේ.

පිටත කණ්ඩායම ලෙස සලකනු ලබන්නේ ක්‍රීඩකයින් හැර තරඟ විනිසුරු , සටහන්කරු (මාර්කර්) ,නිරීක්ෂක සහ අතිරේක සහයකරු (කැඩි) , උපකරණ කොටසට ක්‍රීඩාවේ යෙදෙන පන්දුව හැර ක්‍රීඩකයෙකු භාවිතා කරන ඇඳුම් සහ භාවිතයට යොදා ගන්නා දේවල්ය. ගොල්ෆ් රථයද මීට ඇතුලත්ය.

* 18 - 1 පිටස්තර කණ්ඩායමක් මගින් (අවුට් සයිඩ් ඒජන්සි )

නතරව තිබෙන පන්දුවක් පිටස්තර කණ්ඩායමක් විසින් එහාමෙහා කල විටදී ක්‍රීඩකයාට දඬුවමක් නොලැබේ. කෙසේ වෙතත් ක්‍රීඩකයා මීලග පහර එල්ල කරන්නට මත්තෙන් පන්දුව නැවත ලබා දිය යුතුය.

* 18 - 2 ක්‍රීඩකයා , සහය ක්‍රීඩකයා , ක්‍රීඩා සහයකරු හෝ උපකරණ මගින්

(අ) පොදු

ක්‍රීඩකයාගේ පන්දුව ක්‍රීඩාවේ යෙදෙන විට .

(1) ක්‍රීඩකයා , සහය ක්‍රීඩකයා හෝ ඔවුන්ගේ ක්‍රීඩා සහයකරු , නීතියට අදාල නොවන පරිදි එසවීම එහාමෙහා කිරීම , උවමනාවෙන් ඇල්ලීම,(ක්ලබ් බැහැරව ) හෝ

(11) ක්‍රීඩකයාගේ හෝ සහය ක්‍රීඩකයාගේ උපකරණ නිසා පන්දුව එහා මෙහා වීම ක්‍රීඩකයාට පෙනල්ටි පහරක් ලැබේ. පන්දුව නැවත ලබා ගත යුතුය.

යම් විධියකින් ක්‍රීඩකයාගේ අත්වැරැද්දකින් පන්දුව එහාමෙහා වීමක් සිදු වුණොත් දඬුවම් නොලැබේ. එනම්

හෝල් ඇති දුර ප්‍රමාණය මැන බැලීමකදී. (10-4)
මායිම් තුල පන්දුව සොයන විට හෝ නුසුදුසු ක්‍රීඩාංගනයක් මත පන්දුව පතිත වූ විටදී (12-1)
පන්දු ආධාරකයක් හෝ වලේ රැඳවුමක් අලුත්වැඩියා කරන විටදී. (16-1 (ඇ) )
මෑදු තණපියස තිබෙන බුරුල් යමක් ඉවත් කිරීමකදී. (18-2 (ඇ) )
නීතියක් යටතේ පන්දුවක් එසවීම. (20-1 )
නීතියක් යටතේ පන්දුවක් එසවීම හෝ වෙනත් පන්දුවක් තැබීම. (20-3 (අ) )
චංචල බාධකයක් ඉවත් කිරීම. (24-1)

(ආ) පන්දුව එහාමෙහා යාම

ක්‍රීඩාවේ යෙදෙන පන්දුවක් (පහරක් එල්ල කිරීමෙන් බැහැරව ) එහාමෙහා වුවහොත් ක්‍රීඩකයා හට දඬුවම් පහරක් ලැබේ. පහර එල්ල කිරීමට මත්තෙන් පන්දුව යලිත් ස්ථානගත කල යුතුය.

(ඇ) ලිහිල් බාධාවක ගැටී පන්දුව යාම.

ලිහිල් බාධාවක් අතරින් පන්දුව යාමකදී , එය ක්‍රීඩකයා විසින් දැනුම් දීමක් කරන්නට පෙර , ක්‍රීඩකයා සහය ක්‍රීඩකයා හෝ ක්‍රීඩා සහයකරු එය ස්පර්ශ කලහොත් ක්‍රීඩකයාට දඬුවම් පහරක් ලැබේ. නැවත පන්දුව ස්ථානගත කිරීමක් කල යුතුය.

මෘදු තණ පියස මත පන්දුව හෝ පන්දු ලිහිල් බාධකයක් අයින් කිරීමේදී එහාමෙහා වුවහොත් එය නැවත ස්ථානගත කිරීමට ඉඩ ලැබේ. සෘජුව මෙම ක්‍රියාව සිදු වී නැත්නම් දඬුවම් නොලැබේ. එසේ නොවුවහොත් නීතිය 18-2 (අ) හෝ 20-1 යටතේ දඬුවම් පහරකට යටත් වේ.

* 18 - 3 ප්‍රතිවාදී ක්‍රීඩකයා කැඩී හෝ උපකරණ මගින්

(අ) පන්දුව එසවීම.

ක්‍රීඩකයාගේ පන්දුව එසවීමකදී එම පන්දුව ප්‍රතිවාදී ක්‍රීඩකයා ඔහුගේ ක්‍රීඩා සහයකරු හෝ ඔහුගේ උපකරණ මගින් පන්දුව එහාමෙහා වීමක් සිදු වුවහොත් දඬුවම නොලැබෙන අතර ක්‍රීඩකයා විසින් පන්දුව නැවත ස්ථාන ගත කල යුතුය.

(ආ) පන්දුව සෙවීමට බැහැරව

පන්දුව සෙවීමට බැහැරව ප්‍රතිවාදී ක්‍රීඩකයා ඔහුගේ කැඩී හෝ ඔහුගේ උපකරණ මගින් පන්දුව එහාමෙහා වීමක් සිදු වුවහොත් ප්‍රතිවාදී ක්‍රීඩකයාට දඬුවම් පහරක් ලැබේ. ක්‍රීඩකයා විසින් පන්දුව නැවත ස්ථානගත කල යුතුය. (පන්දුවේ දුර ප්‍රමාණය මැනීම වෙනුවෙන් නීතිය 10-4 සහ වැරදි පන්දුවට ක්‍රීඩා කිරීම 15-2 බලන්න. )

* 18 - 4 පහර එල්ල කිරීමකදී සහය ක්‍රීඩකයා කැඩී හෝ උපකරණ මගින්

ක්‍රීඩකයාගේ පන්දුව සහය ක්‍රීඩකයා ඔහුගේ ක්‍රීඩා සහයකරු හෝ උපකරණ මගින් එහාමෙහා වීමක් පන්දුවට සිදු වුවහොත් දඬුවම නොලැබේ. ක්‍රීඩකයා විසින් පන්දුව නැවත ස්ථානගත කල යුතුය.

( වැරදි පන්දුව ක්‍රීඩා කිරීම - නීතිය 15-3 බලන්න. )

* 18 - 5 වෙනත් පන්දුවක් මගින්

ක්‍රීඩාවේ පවතින පන්දුවක් හෝ නතරවී තිබෙන පන්දුවක් , ක්‍රීඩාවේ යොදන තවත් පන්දුවක් මගින් එහාමෙහා වුවහොත් පන්දුව නැවත ස්ථානගත කල යුතුය.

මෙම නීතිය උල්ලංඝනය කිරීම වෙනුවෙන් පෙනල්ටි - හෝල් අහිමි වීම - ස්ට්‍රෝක් දෙකකි.

පන්දුව ස්ථානගත කිරීමක් වෙනුවෙන් ක්‍රීඩකයෙකු නිසි පරිදි ක්‍රියා නොකලහොත් නීතිය 18 යටතේ පොදු දඬුවම ලැබේ. අමතර දඬුවම නොලැබේ.

සටහන - 1 මෙම නීතිය යටතේ පන්දුවක් නැවත ස්ථානගත කිරීමට ඉක්මණින් නොහැකි වුවහොත් වෙනත් පන්දුවක් එය වෙනුවට යොදා ගත යුතුය.

## නීතිය 19 - පන්දුවේ ගමන නතර වීම (බෝල් ඉන් මෝෂන් )

* 19 - 1 පිටස්තර කණ්ඩායමක් මගින් (අවුට් සයිඩ් ඒජන්සි )

ක්‍රීඩාවේ පවතින පන්දුවක් අහම්බෙන් නතර වීම හෝ වෙනස් වීම පිටස්තර කණ්ඩායමක් මගින් සිදු වුවහොත් දඬුවමක් නොලැබෙන අතර පන්දුව නියමිත ස්ථනයේ සිට නැවත ක්‍රීඩා කල යුතුය. එහෙත්

(අ) මෘදු තණ පියස බැහැරව පන්දුව පිටස්තර දෙයක් මත නතර වුවහොත් , එය මායිම් තුල නම් පන්දුව පතිත කිරීමද පටින් ග්‍රීන් මත නම් ස්ථානගත කිරීම කල යුතුය. එසේ කල යුත්තේ පන්දුව නතර වූ ස්ථානය ආසන්න ස්ථානයකදීය.

## (ආ) පන්දුව ක්‍රීඩාවේ තිබියදී

"පහර " එකක් එල්ල කල පසු ක්‍රීඩකයාගේ පන්දුව ක්‍රීඩාවේ පවතින විට , එලෙසට ක්‍රීඩාවේ පවතින පන්දුවක් මගින් එහාමෙහා වීමක් හෝ නතර වීමක් වුනොත් , ක්‍රීඩකයා විසින් පන්දුව නතර වූ ස්ථානයේ සිට ක්‍රීඩා කල යුතුය. නීතිය 16-1 ඊ උල්ලංඝනය නොවේ නම් දඬුවම් නැත. එසේ නොවුනහොත් අදාල දඬුවම් වෙත ක්‍රීඩකයා යටත් වේ.

වෙනත් - "පටින් ග්‍රීන් " සිට පහර එකක් එල්ල කල පසු ක්‍රීඩකයාගේ පන්දුව වෙත පිටස්තර "ඒජන්සියක " ක්‍රීඩාවේ පවතින පන්දුවක් නම් ( නීතිය 19-1 (ආ) බලන්න.)

නීතිය උල්ලංඝනය කිරීම වෙනුවෙන් දඬුවම් - තරගයක " හෝල් " අහිමි වීම හෝ පහරවල් දෙකක් අහිමි වීම.